www.slida.lk

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report 2021

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
இலங்கை அபிவிருத்தி நிர்வாக நிறுவனம்
Sri Lanka Institute of Development Administration



2021

වාර්ෂික වාර්තාව

පටුන

1. වඩා යහපත් හෙට දවසක් උදෙසා රාජ්‍ය අංශය සවිබල ගැන්වීම 4

දැක්ම 5

මෙහෙවර 5

උපායමාර්ගික ඉලක්ක 5

ප්‍රධාන කාර්යයන් 5

අපගේ අගනාකම් 5

උපායමාර්ගික අභිප්‍රාය 5

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභා සභාපතිගේ පණිවිඩය 6

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය 7

2. මූල්‍ය තොරතුරු 8

2.1 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 8

2.2 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය 9

2.3 2021 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය 10

2.4 2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම් / ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය. 12

3. පාලක සභාවේ සාමාජිකයින් 13

4. ජ්‍යෙෂ්ඨ කළමනාකරණය හා අධ්‍යනේන්ද්‍රිය 14

4.1 අධ්‍යනේන්ද්‍රියේ පැතිකඩ 15

4.2 සේවා පහසුකම් සලසන්නන් පිළිබඳ කෙටි සටහන 18

5. ක්‍රියාකාරිත්වය හා ආයතනික ව්‍යුහය 20

5.1 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ක්‍රියාකාරී ව්‍යුහය 20

5.2 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංවිධානාත්මක ව්‍යුහය 21

6. ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් - 2021 22

6.1.1. සේවාරම්භක පුහුණු වැඩසටහන් 23

6.1.2. දීප ව්‍යාප්ත සේවාවන් සඳහා අනිවාර්ය ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් 23

6.1.3. නිපුණතා සංවර්ධන වැඩසටහන - ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය I, II සහ III ශ්‍රේණි 24

6.2 කෙටි කාලීන පුහුණු වැඩසටහන් 25

6.3 ඩිප්ලෝමා වැඩසටහන් 25

6.4 ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් 25

6.5 කළමනාකරණ උපදේශන 27

7. පශ්චාත් උපාධි අධ්‍යයන පාසල (SPS) 28

8. 2021 වසර තුළ පවත්වන ලද විභාග 30

9. තොරතුරු තාක්ෂණය සඳහා වන මධ්‍යස්ථානය 33

10. භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය 37

11. සාමාන්‍ය පරිපාලනය 38

11.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 38

11.2 මානව සම්පත් කළමනාකරණය 38
11.3 සැපයුම් කළමනාකරණය 39
12. පුස්තකාල හා තොරතුරු සේවා- ආචාර්ය එච්.එස්. වනසිංහ පුස්තකාලය 41
13. 2021 වසර තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විශේෂ සිදුවීම් 43
13.1. රාජ්‍ය සේවයේ කළමනාකරණ නොවන කාණ්ඩයේ කාර්ය මණ්ඩලය සඳහා ඉගෙනුම් සහ සංවර්ධන මූලපිරීම් ශක්තිමත් කිරීම. 43
13.2. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම 43
13.3. රාජ්‍ය කළමනාකරණපති පාඨමාලාව 2020-2022 සඳහා පාඨමාලාහින් බඳවා ගැනීම 44
13.4. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 2021 (විවෘත කණ්ඩායම) සමාරම්භක උත්සවය 44
13.5 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2021 දී සංවර්ධනය කරන ලද නව මෘදුකාංග 45
13.6 විශේෂ ජයග්‍රහණ 46
14. විගණන කමිටුවේ වාර්තාව 47

1. වඩා යහපත් හෙට දවසක් උදෙසා රාජ්‍ය අංශය සවිබල ගැන්වීම

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (ශ්‍රී ලං.සං.ප.ආ./ස්ලීඩා), 1982 අංක 9 දරන පනත මගින් රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශය යටතේ 1982 මැයි මස දී සංස්ථාපිත කරන ලද ආයතනයකි. එය, රාජ්‍ය සේවයේ විධායක නිලධාරීන්ගේ ශක්‍යතා වර්ධනය සහ වෘත්තීය සංවර්ධනය කිරීමෙහිලා වගකීම පවරන ලද ප්‍රමුඛතම ජාතික ආයතනය වේ.

ජනතා අභිලාෂයන් සාක්ෂාත් කිරීමෙහිලා ඉටුකරනු ලබන සිය උත්තුංග මෙහෙවර අතර රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම, රාජ්‍ය අංශයේ ආයතන සඳහා කළමනාකරණ උපදේශන ලබා දීම සහ පර්යේෂණ කටයුතුවල නිරත වීම සඳහා රාජ්‍ය අංශයේ නිලධාරීන් දිරි ගැන්වීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ප්‍රධාන කර්තව්‍යන් වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට පශ්චාත් උපාධි මට්ටමේ උපාධි පිරිනැමීමේ බලය ලබාදී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි ආයතනය මගින් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා ප්‍රදානය කරනු ලබයි. අමාත්‍යාංශ ලේකම්වරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් සිය කළමනාකරුවන් වෙතින් සුවිශේෂ දායකත්වයන් අපේක්ෂා කරන්නා වූ පරිසරයකට මුහුණ දීම සඳහා උපකාරී වීම පිණිස මෙම පාඨමාලා හදුන්වා දී ඇත.

රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ණ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභාව විසින් ආයතනයේ ප්‍රතිපත්ති සම්බන්ධව තීරණය කිරීමේ වගකීම දරනු ලබයි.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ලන්ඩන්හි සිවිල් සේවා කොලීජිය, සිංගප්පූරුවේ සිවිල් සේවා කොලීජිය, චීනයේ බීජිංහි විදේශ අධ්‍යයන විශ්වවිද්‍යාලය, ඉන්දියාවේ ලාල් බහදූර් ශාස්ත්‍රී ජාතික පරිපාලන ඇකඩමිය, ඔස්ට්‍රේලියාවේ මොනාෂ් විශ්වවිද්‍යාලය, මාලදිවයිනේ සිවිල් සේවා පුහුණු ආයතනය, චීනයේ විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ හුවාසොං විශ්වවිද්‍යාලය වැනි පුහුණු සහ පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සලසනු ලබන විදේශ විශ්වවිද්‍යාල හා පුහුණු ආයතන කිහිපයක්ම සමග ජාලගත වී ඇත. 2018 වසරේ සිට ස්ලීඩා ද්විපාර්ශ්වික පුහුණු සහ පර්යේෂණ සහයෝගිතාව වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් (MOU) හරහා අන්‍යෝන්‍ය සබඳතාවක් පවත්වා ගෙන යයි.

- පාකිස්තානු ඉස්ලාමීය ජනරජයේ රාජ්‍ය ප්‍රතිපත්ති සඳහා වන ජාතික පාසල
- ඉන්දියාවේ හයිද්‍රාබාද්හි රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ ආයතනය

ද්විපාර්ශ්වික පුහුණුව, දැනුම බෙදාගැනීම සහ සහයෝගීතාව වැඩිදියුණු කිරීම සඳහා 2021 දී ස්ලීඩා විසින් ‘ශ්‍රී ලංකාවේ මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය (AHRP)’ සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත.

පසුගිය වසර 39 පුරා දැනුම හා කුසලතා වර්ධනය කිරීම, සංවිධානශීලීත්වය වර්ධනය කිරීම සහ පර්යේෂණ පැවැත්වීම යනාදී සේවාවන් ඉටුකරමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ශක්තිමත් ආයතනයක් ලෙස වර්ධනය වී ඇත.

දැක්ම

ආසියාවේ රාජ්‍ය අංශවල ඉගෙනුම හා සංවර්ධනය පිළිබඳ විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට පත් වීම.

මෙහෙවර

ඉගෙනුම, සංවර්ධනය, උපදේශන සේවා සහ පර්යේෂණ මගින් නිර්මාණාත්මකවූත් අති නවීනවූත් පුරවැසි කේන්ද්‍රීයවූත් රාජ්‍ය සේවයක් සඳහා අවශ්‍ය වන අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා පහසුකම් සැලසීම.

උපායමාර්ගික ඉලක්ක

- වඩාත් ජවසම්පන්න සහ කාර්යක්ෂම රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීමෙහිලා වන ජාතික සංවර්ධන ඉලක්කයට දායක වීම.
- ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සංවර්ධනයට දායක වීමේ දී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කිරීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වන පරිදි පාර්ශ්වකරුවන් තුළ ආයතනය කෙරෙහි ධනාත්මක ප්‍රතිරූපයක් ඇති කිරීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දකුණු හා අග්නිදිග ආසියාවේ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සංවර්ධනය සඳහා වන සහයෝගිතා මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීම.

ප්‍රධාන කාර්යයන්

- ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් තුළින් රාජ්‍ය අංශයේ කළමනාකරණ කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය.
- පශ්චාත් උපාධි වැඩසටහන් තුළින් රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති හා කළමනාකරණයට අදාළ කාර්ය සාපලාය අරමුණු කරගත් පර්යේෂණ අධ්‍යයන කෝෂ්ඨාගාරයක් සංවර්ධනය කිරීම.
- රාජ්‍ය අංශයේ ආයතනවල සහ රාජ්‍ය හිමිකාරිත්වය දරන ව්‍යාපාරවල ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ආයතනික සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- රාජ්‍ය අංශය සඳහා කාර්යක්ෂමතා කඩඉම් සහ භාෂා ප්‍රවීණතා විභාග පැවැත්වීම.

අපගේ අගනාකම්

විශිෂ්ඨත්වය, කැපවීම, විවිධත්වය, වගවීම, තිරසාර බව

උපායමාර්ගික අභිප්‍රාය

“වඩාත් යහපත් හෙට දවසක් උදෙසා ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය සවිබල ගැන්වීම”

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභා සභාපතිගේ පණිවිඩය



ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2021 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යය සාධන වාර්තාවේ නිරීක්ෂණ සම්බන්ධයෙන් මෙම පණිවිඩය නිකුත් කිරීමට හැකිවීම පිළිබඳව මම මහත්සේ සතුටු වෙමි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය රාජ්‍ය විධායක නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය, අරමුණු කේන්ද්‍රීය පර්යේෂණ අධ්‍යයන සහ සංවිධිත කළමනාකරණ සේවා ඔස්සේ රාජ්‍ය ආයතනයන්හී හා රජය සතු ව්‍යවසායන්හි සඵලතාව හා කාර්යක්ෂමතාව නංවාලීම අරමුණු කරගෙන අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාකාරී වන රාජ්‍ය විධායක නිලධාරීන්ගේ පුහුණු ආයතනය වේ.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය 2021 වර්ෂයේදී නිම කරන ලද කාර්යයන් නිරීක්ෂණයට භාජන කිරීමේදි කොරෝනා වසංගත තත්ත්වය හමුවේ වුව ද දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නිලධාරින් 578 ක් සඳහා සේවාරම්භක පුහුණු පාඨමාලා 05 ක් සාර්ථකව පවත්වා ඇති බව පෙනේ. එම වැඩසටහන් සඳහා විශිෂ්ඨ රාජ්‍ය නිලධාරීන් රැසක් සම්පත්දායකයන් වශයෙන් සේවය ලබාදී ඇත. රාජ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවන්ට අනුකූලව අනිවාර්ය වන ධාරිතා වර්ධන වැඩසටහන් 24 ක්ද පවත්වා ඇති අතර එමඟින් නිලධාරින් 1008 කට පුහුණුව ලබාදී ඇත. ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලා තුනක්, කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව, පරිපාලන නීති සම්බන්ධ ඩිප්ලෝමාව හා අභ්‍යන්තර විගණන ඩිප්ලෝමාව යන පාඨමාලා මඟින් නිලධාරින් 221 දෙනෙකුගේ ධාරිතා සංවර්ධනය ද 2021 වසරේදි ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සිදු කර තිබේ. ආයතනයේ භාෂා අංශය මඟින් රාජ්‍ය සේවයේ සිංහල, ඉංග්‍රීසි,දෙමළ යන භාෂා කුසලතා නැංවීම පිණිස නිලධාරින් 497 ක් සඳහා පුහුණු පාඨමාලා පවත්වා ඇත.මෙම ධාරිතා සංවර්ධන වැඩසටහන් වලට අතිරේකව රාජ්‍ය සේවය ජනතා කේන්ද්‍රීය ඉලක්කයක් වෙත දිශානත කිරීම පිණිස විවිධ රාජ්‍ය ව්‍යවසාය ආයතනයන්හි ඉල්ලීම ඉටුකරමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය කළමනාකරණ උපදේශන සේවා රාශියක්ද 2021 වසරේදි සම්පාදනය කර ඇත.

සමාලෝචිත වර්ෂය තුළ මෙසේ අපේක්ෂිත ඉලක්කයන් කරා ලඟාවීම පිණිස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත ලබාදුන් අනගි උපදෙස් සම්බන්ධයෙන් ගරු රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාට ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභාවෙහි සභාපති වශයෙන් එහි සියලු සාමාජිකයන්ට ද මාගේ ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාව කරගනු කැමැත්තෙමි. එලෙසම ආයතනික ඉලක්ක සපුරාගැනීම පිණිස දක්වන ලද කැපවීම උදෙසා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි අධ්‍යක්ෂ ජනරාල් සහ කාර්ය මණ්ඩලය වෙත අමාත්‍යාංශ ලේකම් වශයෙන් මගේ ප්‍රසාදය පිරිනමන අතරම අනාගතයේ දී වඩාත් සාර්ථක ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය ධෛර්යයද නොඅඩුව හිමි වේවායි ප්‍රාර්ථනා කරමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
සභාපති,
පාලක සභාව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය



ගෝලීය වශයෙන් මුහුණ දෙන්නට සිදු වූ වසංගත අර්බුදය මධ්‍යයේ ගෙවී ගිය 2021 වසරට අදාළ වන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තාවට මෙම පණිවිඩය මා එක් කරන්නේ අදාළ වසරේ ආයතනික කාර්ය සාධනය පිළිබඳ ප්‍රමාණවත් තෘප්තියෙනි.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුව දීප ව්‍යාප්ත සේවාවන් ගණනාවකට බඳවා ගත් නවක නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු, දීප ව්‍යාප්ත සේවාවන් සඳහා අනිවාර්ය ධාරිතා සංවර්ධන වැඩසටහන් හා අනෙකුත් පුහුණු පාඨමාලා රාශියක් 2021 වසරේදි සාර්ථකව පැවැත්වීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට හැකියාව ලැබුණි. මෙහිදී ශ්‍රී ලංකා පරිපාලන සේවය (විවෘත හා සීමිත), ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය හා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය යන සේවාවන්ට අයත් කණ්ඩායම් පහක නිලධාරීන් 578 ක් සඳහා සේවාරම්භක පුහුණු ලබාදීමට හැකියාව ලැබුණි. එලෙසම ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයන්හි නිලධාරීන් 1008 ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමද සිදු කරන ලදී. තවද නිලධාරීන් 221 ක් සඳහා ඩිප්ලෝමා වැඩසටහන් 6ක් පවත්වන ලදී.

කොවිඩ් අර්බුදය නිසා ඇතිවූ අභියෝගකාරී වාතාවරණය තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයට එක්වන නවක නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණු කිසිදු බාධාවකින් තොරව ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ඒකරාශී කර නේවාසිකව පැවැත්වීම ප්‍රථම වරට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වන ලද්දේ 2021 වසරේදීය.

පසුගිය වසරේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග අංශය ඔස්සේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි තෝරාගත් විභාග පැවැත්වීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවී තිබුණු අතර ඒ අනුව අපේක්ෂකයින් 649 ක් සඳහා අභ්‍යන්තර විභාග 12 ක්ද අපේක්ෂකයින් 3562 ක් සඳහා බාහිර විභාග 19ක්ද පවත්වන ලදී. ආයතනයේ භාෂා අධ්‍යයන අංශය මඟින් නිලධාරීන් 497කට භාෂා පාඨමාලා පවත්වා තිබේ. පශ්චාත් උපාධි අංශය මඟින් 2021 වසරේදි පාඨමාලා සඳහා නිලධාරීන් 50 ක් ලියාපදිංචි කරගෙන ඇත. මීට අතිරේකව නිලධාරීන් 217 ක් මේ වන විටත් පශ්චාත් උපාධි පාඨමාලා හදාරමින් සිටිති.

ආයතනයේ සේවා සම්පාදන කටයුතු පවත්වාගෙන යාම සඳහා මෙන්ම ආයතනයේ සේවාවන්හි ගුණාත්මකභාවය දියුණු කිරීම සඳහා ද තොරතුරු තාක්ෂණ අංශය මඟින් 2021 වසර තුළ මෘදුකාංග 7ක් නිර්මාණය කරන ලදී.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුව සියළු සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් රාජ්‍ය සේවාවේ පුහුණු වැඩසටහන් වඩාත් ඵලදායීව ගුණාත්මකව සිදුකිරීමට අප දැරූ උත්සහයන්ගේ සාර්ථකත්වය පිළිබඳව ඉතා සතුටින් සිහිකරන අතර එම සාර්ථකත්වයට උර දුන් අපගේ කාර්ය මණ්ඩලයේ කැපවීම, සහයෝගය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම අතිශයින් අගයකරමි.

මෙම සියළු ඉලක්ක සපුරාගැනීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට නිබඳ ශක්තියක්වූ රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමාටද නිසි මහ පෙන්වීම හා දායකත්වය ලබාදුන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභාවටද අප ආයතනය වෙනුවෙන් මගේ කෘතවේදීත්වය මෙයින් පලකර සිටිමි.

අචාර්ය පී.ජී.ඩී. ප්‍රදීපා සේරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

2. මූල්‍ය තොරතුරු

2.1 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2021	2020
වත්කම්		රු.ශත	රු.ශත
ජංගම වත්කම්			
බැංකු ශේෂ	**03**	27,767,239.67	24,462,465.87
ත්‍රෛමාසික තැන්පතු	**04**	334,038,455.06	320,652,293.25
ලැබිය යුතු ශේෂ	**05**	48,147,705.42	46,843,764.05
අතැති තොග	**06**	6,447,974.83	5,537,033.28
කලින් කළ ගෙවීම්	**07**	3,349,144.88	4,059,589.00
අත්තිකාරම්		69,802.00	69,802.00
කාර්ය මණ්ඩල ණය	**08**	13,984,709.70	14,151,150.57
		433,805,031.56	**415,776,098.02**
ජංගම නොවන වත්කම්			
දේපළ,යන්ත්‍ර සහ උපකරණ	**09**	512,273,369.66	439,323,810.99
පාරිතෝෂික අරමුදල් ආයෝජනය	**10**	42,692,642.41	40,776,844.34
තැන්පතු ගිණුම්	**11**	1,299,500.00	1,299,500.00
		556,265,512.07	**481,400,155.33**
මුළු වත්කම්		**990,070,543.63**	**897,176,253.35**
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවිය යුතු තැන්පතු	**12**	18,186,857.65	20,441,324.41
ඉදිරියට ලැබූ ගාස්තු	**13**	105,568,928.59	106,561,290.03
උපචිත වියදම්	**14**	3,385,385.55	4,480,123.73
ලැබීම් අවිනිශ්චිතතාවය සඳහා වෙන්කිරීම්		1,914,575.83	7,532,692.96
		129,055,747.62	**139,015,431.13**
ජංගම නොවන බැරකම්			
දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය	**15**	18,205,648.23	19,860,707.06
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	**16**	35,718,857.50	34,741,715.00
		53,924,505.73	**54,602,422.06**
මුළු බැරකම්		**182,980,253.35**	**193,617,853.19**
ශුද්ධ වත්කම්		**807,090,290.28**	**703,558,400.16**
ශුද්ධ වත්කම්/ස්කන්ධය			
විලම්භිත ආදායම -භාණ්ඩාගාර දායකත්වය		530,983,210.45	544,802,377.59
වෙනත් සංචිත-වත්කම් ප්‍රත්‍යාගණනය සංචිත	**17**	161,121,423.94	58,615,807.00
සමුච්චිත අතිරික්තය / (ඌණතාවය)	**18**	114,985,655.89	100,140,215.57
මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය		**807,090,290.28**	**703,558,400.16**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2021	2020
		රු.ශත	රු.ශත
ආදායම			
භාණ්ඩාගාරයෙන් ලද මුදල්	**19**	139,299,167.14	137,642,011.29
වෙනත් ආදායම්			
පාඨමාලා ගාස්තු	**20**	52,000.00	500.00
ශාලා කුලියට දීම		14,427,162.97	14,759,696.02
ප්‍රකාශන අලෙවි කිරීම		35,582.00	57,190.00
ආයෝජන මගින් ලැබූ ආදායම	**21**	17,218,579.03	23,512,978.80
ණය පොලී		607,168.51	545,298.98
කුලී ආදායම්	**22**	6,057,464.89	7,971,788.51
කල්බදු කුලී		1,655,058.83	1,655,058.33
පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය		17,338,592.50	18,712,003.71
භාෂා වැඩසටහන්		1,468,050.00	3,562,360.00
උපදේශන වැඩසටහන්	**23**	36,048,031.93	14,032,754.44
ආදායමෙන් ආයතනයට වෙන් කිරීම්		11,252,512.00	8,436,678.45
විවිධ ආදායම්	**24**	19,767,087.53	11,504,728.53
මුළු ආදායම		**265,226,457.33**	**242,393,047.06**
වියදම්			
පුද්ගල පඩිනඩි	**25**	111,658,312.84	112,686,048.16
කාර්ය මණ්ඩල සුභසාධනය	**26**	3,658,596.88	3,317,128.95
ප්‍රවාහන සහ යැපීම් දීමනා	**27**	630,907.50	356,566.10
උපයෝගි සහ වෙනත් සේවා	**28**	26,615,991.20	27,817,214.60
ප්‍රවාහන වියදම්	**29**	3,779,941.98	3,633,601.56
ස්ථාවර වත්කම් අලුත්වැඩියාව හා නඩත්තු කිරීම	**30**	4,899,289.88	3,968,285.00
සැපයුම් සහ අවශ්‍යතා	**31**	3,786,759.39	3,716,961.23
මූල්‍ය වියදම්	**32**	930,179.00	743,353.00
පුස්තකාල සේවා	**33**	239,972.00	306,332.50
පුහුණු සහ ඇගයීම්	**34**	81,600.00	72,160.00
ප්‍රකාශන සහ තොරතුරු සේවා	**35**	256,902.00	-
ක්ෂයවීම්	**36**	37,306,627.56	36,891,534.85
පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය	**37**	3,855,763.40	6,578,888.05
ඉංග්‍රීසි වැඩසටහන්	**38**	209,750.00	1,349,310.00
උපදේශන සේවා	**39**	36,048,031.93	14,032,754.44
පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන්කිරීම්		2,395,012.50	6,411,337.00
ලැබීම් අවිනිශ්චිතතාවය සඳහා වෙන්කිරීම්		-	3,210,085.05
මුළු වියදම්		**236,353,638.06**	**225,091,560.49**
කාල සීමාව සඳහා අතිරික්ත/ (ඌනතාවය)		**28,872,819.27**	**17,301,486.57**

2.3 2021 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
2021 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය

සාමාන්‍ය ක්‍රියාකාරකම් මඟින් මුදල් ප්‍රවාහය	2021 රු. ශත	2020 රු. ශත
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්ත/ (ඌණතාවය)	**28,872,819.27**	**17,301,486.57**
අරමුදල් සංචලනයට බලනොපාන අයිතම සඳහා ගැළපුම්		
මූල්‍ය නොවන වෙනස්වීම්		
ක්ෂය වීම	37,306,627.56	36,891,534.85
අධි ක්ෂය වෙන්කිරීම්-නුවරඑළිය 2020	(40,664.97)	-
ක්‍රමක්ෂය	(21,549,167.14)	(27,942,011.29)
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	2,395,012.50	6,411,337.00
කෙටි කාලීන තැන්පතු සඳහා පොලී	(17,218,579.03)	-
ලැබීම් අවිනිශ්චිතතාවය සඳහා වෙන්කිරීම්	(5,618,117.13)	3,210,085.05
පෙර වසරේ ගැලපුම්	(14,027,378.95)	14,797,347.24
මෝටර් වාහන තක්සේරු කිරීමේ බලපෑම	-	(9,211,381.47)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය (ඌණතාවය)	**10,120,552.11**	**41,458,397.95**
තොග අඩුවීම් (වැඩිවීම්)	(910,941.55)	324,303.70
අත්තිකාරම්වල අඩුවීම් (වැඩිවීම්)	-	223,538.64
කලින් කළ ගෙවීම් වල අඩුවීම් (වැඩිවීම්)	710,444.12	(578,827.67)
කාර්ය මණ්ඩල ණය අඩුවීම් (වැඩිවීම්)	166,440.87	1,908,684.56
ලැබීම්වල අඩුවීම් (වැඩිවීම්)	(1,303,941.37)	(24,785,434.94)
ගෙවියයුතු තැන්පතු වල වැඩිවීම් (අඩුවීම්)	(2,254,466.76)	(1,370,687.27)
උපචිත වියදම් වල වැඩිවීම් (අඩුවීම්)	(1,094,738.18)	1,364,485.52
කෙරෙමින් පවතින ව්‍යාපෘතිවල වැඩිවීම් (අඩුවීම්)	-	1,644,343.69
ඉදිරියට ලැබූ ගාස්තු වැඩිවීම් (අඩුවීම්)	(992,361.44)	714,767.56
ගෙවන ලද පාරිතෝෂික	(1,417,870.00)	(4,609,438.50)
මෙහෙයුම් කටයුතුවලින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(7,097,434.31)**	**(25,164,264.71)**
ආයෝජන කටයුතුවලින් ලැබෙන මුදල් ප්‍රවාහය		
ගොඩනැගිලි අත්පත් කරගැනීම	(3,659,722.22)	(4,507,809.24)
ගෘහ භාණ්ඩ හා සවිකරණවල අඩුවීම	(1,597,336.60)	742,255.36
කාර්යාලීය උපකරණවල අඩුවීම	(1,019,145.00)	638,263.52
විදුලි උපාංගවල අඩුවීම	(190,500.00)	2,827,221.60
පරිගණක මිලදී ගැනීම්	(112,410.00)	(184,450.00)
පොත්පත් මිලදී ගැනීම්	(94,904.50)	(125,009.95)
අනෙකුත් වත්කම්වල අඩු වීම	(539,936.00)	371,006.86
රථ වාහන පුනරුත්ථාපනය	(495,950.00)	-
පාරිතෝෂික අරමුදල් ආයෝජනය	(1,915,798.07)	(2,695,184.80)
කෙටිකාලීන තැන්පතු සඳහා පොලී	17,218,579.03	-
කෙටිකාලීන තැන්පතු වැඩිවීම්	(13,386,161.81)	(18,360,973.91)
ආයෝජන කටයුතු වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහය	**(5,793,285.17)**	**(21,294,680.56)**
මූල්‍ය කටයුතු වලින් ලැබෙන මුදල් ප්‍රවාහය		
රජයේ ප්‍රතිපාදන - ප්‍රාග්ධනය	7,730,000.00	8,200,000.00

දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයෙහි වැඩිවීම්(අඩුවීම්)	(1,655,058.83)	(1,655,058.83)
මූල්‍ය කටයුතුවලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහය	**6,074,941.17**	**6,544,941.17**
මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	3,304,773.80	1,544,393.85
කාල සීමාව ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ	24,462,465.87	22,918,072.02
කාල සීමාව අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	**27,767,239.67**	**24,462,465.87**

2.4 2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම් / ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම් / ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

	පාලන ආයතනයේ හිමිකරුවන්ට අදාළ වන			මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධ
	සහභාගි වූ ප්‍රාග්ධනය	වෙනත් සංචිත	සමුච්චිත අතිරික්ත/(ඌණතාවය)	
	රු.ශත	රු.ශත	රු.ශත	රු.ශත
2020 ජනවාරි 01 දිනට ශේෂය	564,544,388.88	12,015,807.00	68,981,510.82	645,541,706.70
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය		46,600,000.00		46,600,000.00
ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස් වීම				
ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ගේ වෙනස් වීම				
පෙර වසර හා ගැළපුම්			13,857,218.18	13,857,218.18
නැවත ප්‍රකාශිත ශේෂය	**564,544,388.88**	**58,615,807.00**	**82,838,729.00**	**705,998,924.88**
2020 වර්ෂය සඳහා ශුද්ධ වත්කම් / ස්කන්ධයෙහි වෙනස				
භාණ්ඩාගාරයෙන් ලැබෙන දායකත්වය - ප්‍රාග්ධනිත	8,200,000.00			8,200,000.00
විලම්භිත ආදායම් ක්‍රමක්ෂය	(27,942,011.29)			(27,942,011.29)
කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය)			17,301,486.57	17,301,486.57
2020 දෙසැම්බර් 31 ට ඉදිරියට ගෙනා ශේෂය	**544,802,377.59**	**58,615,807.00**	**100,140,215.57**	**703,558,400.16**
2021 ජනවාරි 01 ට ශේෂය	544,802,377.59	58,615,807.00	100,140,215.57	703,558,400.16
ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සංචිත		102,209,253.94		102,209,253.94
වෙනත් ආයතනවලින් මාරු කල වත්කම්		296,363.00		296,363.00
ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස් වීම				
ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස් වීම				-
පෙර වසර සඳහා ගැළපුම්			**(14,027,378.95)**	**(14,027,378.95)**
නැවත ප්‍රකාශිත ශේෂය	**544,802,377.59**	**161,121,423.94**	**86,112,836.62**	**792,036,638.15**
2021 වර්ෂයට ශුද්ධ වත්කම් / ස්කන්ධයෙහි වෙනස				
භාණ්ඩාගාරයෙන් ලැබෙන දායකත්වය - ප්‍රාග්ධනිත	7,730,000.00			7,730,000.00
විලම්භිත ආදායම් ක්‍රමක්ෂය	(21,549,167.14)			(21,549,167.14)
කාල සීමාව සඳහා අතිරික්තය/(හිඟය)			28,872,819.27	28,872,819.27
2021 දෙසැම්බර් 31 ට ඉදිරියට ගෙනා ශේෂය	**530,983,210.45**	**161,121,423.94**	**114,985,655.89**	**807,090,290.28**

3. පාලක සභාවේ සාමාජිකයින්

1982 අංක 9 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ 6 (1) වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය පරිපාලන ගරු අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා පාලක සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් පුද්ගලයෝ පත් කරනු ලැබූහ.

ජේ.ජේ.රත්නසිරි මහතා -සභාපති
ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

ගාමිණී එස්. සෙනරත් මහතා -සාමාජික
අග්‍රාමත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය

මහාචාර්ය. කේ.කපිල.සී.කේ පෙරේරා -සාමාජික
ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

සුමිත් අබේසිංහ මහතා -සාමාජික
සභාපති, මුදල් කොමිෂන් සභාව

කෞෂාල් මෙන්ඩිස් මහතා -සාමාජික
අධ්‍යක්ෂ, මානව සම්පත් සහ පරිපාලනය
ගැමා පිසාක්‍රාෆ්ට් ලංකා (පුද්ගලික) සමාගම

ගෝඨාභය ජයරත්න මහතා -සාමාජික
හිටපු ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

නිශාන්ත වීරසිංහ මහතා -සාමාජික
අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය

එම්. එස්. එස්. එස්. ප්‍රනාන්දු මහතා -සාමාජික
මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, මුදල් අමාත්‍යාංශය

එන්. එච්. එම්. චිත්‍රානන්ද මහතා -සාමාජික
අතිරේක ලේකම්, අභ්‍යන්තර ආරක්ෂාව, ස්වදේශ කටයුතු සහ
ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

ආර්. ජී. පණ්ඩිත කෝරළගේ -සාමාජික
අධ්‍යක්ෂ, ප්‍රධාන මානව සම්පත් නිලධාරි,
එයිටිකන් ස්පෙන්ස් පුද්ගලික සමාගම

ආචාර්ය පී.ජී.ඩී. ප්‍රදීපා සේරසිංහ මහත්මිය -සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

4. ජ්‍යෙෂ්ඨ කළමනාකරණය හා අධ්‍යනේක්ෂිය

ආචාර්ය පී.ජී.ඩී. ප්‍රදීපා සේරසිංහ මහත්මිය
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං. ප. සේ - විශේෂ ශ්‍රේණිය)

දර්ශන විශාරද උපාධිය (උරුම කළමනාකරණය)- පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MBA) - රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ විද්‍යායතනය- බර්මින්හැම් විශ්ව විද්‍යාලය - එක්සත් රාජධානිය
ශාස්ත්‍රවේදී උපාධිය (ගෞරව) - ජන සන්නිවේදනය සහ සිංහල, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
විද්‍යාවේදී උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
ප්‍රධාන පුහුණුකරු- සිවිල් සේවා විද්‍යාලය, සිංගප්පූරුව
දරා ඇති තනතුරු;
අධ්‍යක්ෂ- ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය,
ලේකම්- ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
අතිරේක ලේකම්- සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
අතිරේක ලේකම්- රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

ජේ.එස්.ප්‍රසාද් පියසේන මහතා
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මූල්‍ය)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං. ප. සේ - විශේෂ ශ්‍රේණිය)

සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කැළණිය විශ්ව විද්‍යාලය.
ලේඛකත්ව හා සන්නිවේදනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

නෙරංජලා ජේ. ජයසුන්දර මහත්මිය
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ආයතනික සංවර්ධන)

පාරිසරික ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය, කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (ගෞරව), පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
පරිසර කළමනාකරණය පිළිබඳ වෘත්තීය සහතිකය (කාල් දුයිෂ්බර්ග් ගෙසෙල්ෂැෆ්) ,ජර්මනිය
පුහුණු ක්‍රමවේදයන් පිළිබඳ සිංගප්පූරු සිවිල් සේවා විද්‍යාලයේ සහතිකලත් ප්‍රධාන පුහුණුකරු
එක්සත් ජනපද වන සංරක්ෂණ සේවය විසින් සහතික කරන ලද ආපදා කළමනාකරණයේ හදිසි අවස්ථා විධාන පද්ධතිය පිළිබඳ ජාතික පුහුණුකරු.

ඩබ්ලිව්.එම්.එම්.ජී.ඩී. විජේකෝන් මහතා
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ හා සංවර්ධන / කළමනාකරණ නොවන පුහුණු)

විද්‍යාපති උපාධිය (නාගරික පරිසර කළමනාකරණය), (AIT- තායිලන්තය).
ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය (භූගෝල විද්‍යාව), කොළඹ විශ්ව විද්‍යාලය.

ආචාර්ය එස්.ආර්.එස්.එන්. සුදසිංහ මහත්මිය
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) (පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා)

සංවර්ධන පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය (රාජ්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය පිළිබඳ විශේෂඥ)
ශාස්ත්‍රපති උපාධිය (ආර්ථික විද්‍යාව) කොළඹ විශ්ව විද්‍යාලය
ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ විශ්ව විද්‍යාලය)
ශාස්ත්‍රවේදී උපාධිය (ගෞරව) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

4.1 අධ්‍යනේන්ද්‍රියේ පැතිකඩ

ඒ. ලොකුගමගේ මහතා
ජ්‍යෙෂ්ඨ උපදේශක (2021.01.04 දින දක්වා)
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (ශ්‍රී ලං. ග. සේ. - I ශ්‍රේණිය)

ශාස්ත්‍රපති (මූල්‍ය ආර්ථික) කොළඹ විශ්ව විද්‍යාලය , පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ආර්ථික සංවර්ධනය)
පශ්චාත් උපාධි ඩිප්ලෝමා (සමායතන හා ක්‍රමෝපායික මූල්‍ය)

තනුක්ෂා අබේවර්ධන මෙනවිය
ජ්‍යෙෂ්ඨ උපදේශක
ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං. ප. සේ - I ශ්‍රේණිය)

ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, (ICU) , ටෝකියෝ, ජපානය
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පාරිසරික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
ඊ-පාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

එම්.එස් අනුරුද්ධ මහතා
ජ්‍යෙෂ්ඨ උපදේශක (2021.02.03 දින දක්වා)
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (ශ්‍රී ලං. ග. සේ. - I ශ්‍රේණිය)

ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය(MBA)- රජරට විශ්ව විද්‍යාලය
ශාස්ත්‍රපති උපාධිය (ආර්ථික විද්‍යාව) කැලණිය විශ්ව විද්‍යාලය
වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී (ශ්‍රී ලංකාව)
වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී (ලන්ඩන්)
ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (BCIS)
අලෙවි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව

කේ.ප්‍රසන්න චන්දිත් මහතා
ජ්‍යෙෂ්ඨ උපදේශක
ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං. ප. සේ - විශේෂ ශ්‍රේණිය)

ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය රජරට විශ්වවිද්‍යාලය
විද්‍යාවේදී උපාධිය,පේරාදෙණිය විශ්ව විද්‍යාලය.
තිරසාර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපන ඩිප්ලෝමාව, ස්වීඩනයේ උප්සලා විශ්වවිද්‍යාලය.
රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව, ස්වීඩනය
සහතිකලත් මානව සම්පත් විගණක

එස්.ඩී.එන්.යූ සේනාධීර මහතා
ජ්‍යෙෂ්ඨ උපදේශක/ප්‍රධානී/භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං. ප. සේ - විශේෂ ශ්‍රේණිය)

රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ඕස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් විශ්වවිද්‍යාලය
වාග් විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - කැළණිය විශ්වවිද්‍යාලය
ශාස්ත්‍රවේදී උපාධිය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ශාන්ත වීරසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ උපදේශක (2021.05.10 දින දක්වා)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං. ප. සේ - විශේෂ ශ්‍රේණිය)

ඉ - රාජ්‍යය පිළිබඳ රාජ්‍ය පරිපාලනය ශාස්ත්‍රපති උපාධිය (PIM-ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය),
ආයතනික කළමනාකරණය ශාස්ත්‍රපති උපාධිය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය),
අධ්‍යාපනවේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ විශ්වවිද්‍යාලය),
ඉ-රාජ්‍යය පිළබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PIM-ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය),
විද්‍යාවේදී උපාධිය, කැළණිය විශ්ව විද්‍යාලය,
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
ගුරු පුහුණු සහතිකය (ජාතික අධ්‍යාපන ආයතනය NIE),
ප්‍රාදේශීය පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය සහ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද.

ආර් රුෂාන්දන් මහතා
ජ්‍යෙෂ්ඨ උපදේශක
ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං. ප. සේ - I ශ්‍රේණිය)

සංවර්ධන අධ්‍යයන ශාස්ත්‍රපති උපාධිය, මෙල්බර්න් විශ්වවිද්‍යාලය,
සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ඉන්දියාව,
පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධිය පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
දරිද්‍රතාවය පිටුදැකීමේ උපාය මාර්ග පිළිබඳ පශ්චාත් උපාධි සහතිකය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය.

අනුෂා බටවල ගමගේ මහත්මිය
ජ්‍යෙෂ්ඨ උපදේශක
ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං. ප. සේ - I ශ්‍රේණිය)

ස්ත්‍රී පුරුෂ ස්වභාවය හා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (මෙල්බර්න් විශ්ව විද්‍යාලය, ඕස්ට්‍රේලියාව)
රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (ශ්‍රී ලං. සං. ප. ආයතනය)
කෘෂි කාර්මික ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය (කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය)
ඉ- රාජ්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (කුසලතා)(පිරිස් කළමනාකරණය පිළිබඳ වරලත් ආයතනය)
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව (කුසලතා) (ශ්‍රී ලං. සං. ප. ආයතනය)
උද්භිද විද්‍යා විශේෂවේදී ගෞරව උපාධිය (කොළඹ විශ්ව විද්‍යාලය)
ආශ්‍රිත සමාජික (පිරිස් කළමනාකරණය පිළිබඳ වරලත් ආයතනය)
ප්‍රධාන පුහුණුකරු- සිවිල් සේවා විද්‍යාලය, සිංගප්පූරුව

සමන්ති සේනානායක මෙනවිය
ජ්‍යෙෂ්ඨ උපදේශක
ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං. ප. සේ - I ශ්‍රේණිය)

තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාපති උපාධිය (මෙල්බර්න් විශ්ව විද්‍යාලය, ඕස්ට්‍රේලියාව)
තොරතුරු කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය)
ඉ- රාජ්‍ය පිළිබඳ ඩිප්ලෝමාව (පශ්චාත් උපාධි ආයතනය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)
රාජ්‍යතාන්ත්‍රික හා ලෝක සබඳතා පිළිබඳ ඩිප්ලෝමාව (බණ්ඩාරනායක රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය)
කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍රය(ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය)
විද්‍යාවේදී උපාධිය (කැළණිය විශ්ව විද්‍යාලය)

කේ.ආර් ගංගාධර මහතා
ජ්‍යෙෂ්ඨ උපදේශක
ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං. ප. සේ - I ශ්‍රේණිය)

ජාත්‍යන්තර හා සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය (ඔ.ජා.වි, ඕස්ට්‍රේලියාව)
ජාත්‍යන්තර හා සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධි ඩිප්ලෝමාව (ඔ.ජා.වි, ඕස්ට්‍රේලියාව)
භූ ගර්භ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (පේරාදෙණිය විශ්ව විද්‍යාලය)
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය)

එන්.එම්.එස්.ඒ බණ්ඩාර මහතා
උපදේශක

තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය, මොරටුව විශ්වවිද්‍යාලය
වන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
වන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,

ජේ. එම්. එච්. එම්. ජී. ජයසේකර මහත්මිය
උපදේශක (2021.12.31 දින දක්වා)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං. ප. සේ - II ශ්‍රේණිය)

ශාස්ත්‍රපති උපාධිය(සමාජ විද්‍යාව), කැළණිය විශ්වවිද්‍යාලය
නීතිවේදී උපාධිය, විවෘත විශ්වවිද්‍යාලය
ශාස්ත්‍රවේදී කලා (ගෞරව) උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය

එල්.සී.එම් පෙරේරා මහතා
සහකාර උපදේශක (2021.01.31 දින දක්වා)

නාගරික විද්‍යා ශාස්ත්‍රපති උපාධිය, කොරියාවේ සෝල් විශ්ව විද්‍යාලය
කෘතිම බුද්ධිය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (AI), මොරටුව විශ්ව විද්‍යාලය,
කොළඹ විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණවේදී උපාධිය.

4.2 සේවා පහසුකම් සලසන්නන් පිළිබඳ කෙටි සටහන

ඩී.එස්. පත්මසිරි මහතා
අධ්‍යක්ෂ (මුදල්) (2021.10.22 දින දක්වා)
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (ශ්‍රී ලං. ග. සේ. - I ශ්‍රේණිය)

විද්‍යාවේදී විශේෂ උපාධිය(රාජ්‍ය පරිපාලනය), ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාව, වරලත් බලපත්‍රලාභී ආයතනය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය

වයි.අනිරුත්තනන් මහතා
අධ්‍යක්ෂ (පාලන)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං. ප. සේ - I ශ්‍රේණිය)

ප්‍රතිසම රසායන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්ව විද්‍යාලය
සංවර්ධන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලය
මහජන ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ඕස්ට්‍රේලියාවේ RMIT විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී (ගෞරව) විශේෂ උපාධිය(රසායන විද්‍යාව) , යාපනය විශ්ව විද්‍යාලය

ඩබ්. ඒ. කේ. එස්. ද අල්විස් මහතා
අධ්‍යක්ෂ (මුදල්)
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (ශ්‍රී ලං. ග. සේ. - I ශ්‍රේණිය)

රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (මූල්‍ය වෙළඳපල හා නිතීරීති කළමනාකරණය), කොරියානු සංවර්ධන ආයතනය,
රාජ්‍ය මූල්‍ය පිළිබඳ වරලත් ගණකාධිකාරී ආයතනය (සාමාජික),
විද්‍යාවේදී (ගණකාධිකරණ) විශේෂ උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.

ආර්.ඒ.එස්.පී. රණවීර මහත්මිය
ලේඛකාධිකාරී

පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ගණිතය) - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී (ගෞරව)උපාධිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ටී.ඩී. නාරංගොඩ මහත්මිය
අභ්‍යන්තර විගණක

ශාස්ත්‍රපති උපාධිය (ආර්ථික විද්‍යාව) කැළණිය විශ්වවිද්‍යාලය
වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සාමාජික (වරලත් ගණකාධිකාරී ආයතනය - ශ්‍රී ලංකාව)
ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (වරලත් ගණකාධිකාරී ආයතනය - ශ්‍රී ලංකාව)
ව්‍යාපාර කළමනාකරණ, මානව සම්පත් (ගෞරව) උපාධිය කැළණිය විශ්වවිද්‍යාලය
රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

බී.ඒ. ප්‍රියානි බාලසූරිය මහත්මිය
පුස්තකාලයාධිපති

වරලත් පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අධි සාමාජික.
කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය.
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
ශාස්ත්‍රවේදී උපාධිය,කැළණිය විශ්ව විද්‍යාලය.
කළමනාකරණ ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.
පුස්තකාල විද්‍යා ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය.

එස්.එල්.අයි. සමරවික්‍රම මහත්මිය
සහකාර ලේඛකාධිකාරී

ශාස්ත්‍රපති උපාධිය (ආර්ථික විද්‍යාව), කැළණිය විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී උපාධිය මානව සම්පත් කළමනාකරණය (විශේෂ), ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

ඩී. ජී. එස්. සී. නිරෝෂණී මහත්මිය
සහකාර අධ්‍යක්ෂ (විභාග)

ශාස්ත්‍රපති උපාධිය (මූල්‍ය ආර්ථික විද්‍යාව)- කොළඹ විශ්ව විද්‍යාලය
ශ්‍රම අධ්‍යාපනවේදී ගෞරව උපාධිය- කොළඹ විශ්ව විද්‍යාලය

5. ක්‍රියාකාරිත්වය හා ආයතනික ව්‍යුහය

5.1 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ක්‍රියාකාරී ව්‍යුහය



5.2 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංවිධානාත්මක ව්‍යුහය



6. ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් - 2021

ඉගෙනුම් හා සංවර්ධන අංශය යනු ශ්‍රී.ලං.ස.ප ආයතනයෙහි (ස්ලීඩා) සියලු ඉගෙනුම් හා සංවර්ධන ක්‍රියාකාරකම් සමඟ කටයුතු කරන කේන්ද්‍රීය අංශයයි. එය රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ඉගෙනුම් හා සංවර්ධන සේවා අවශ්‍යතා සපයයි. මෙම අරමුණු සඳහා, රාජ්‍ය අංශයේ වෙනස්වන නිපුණතා වැඩි දියුණු කිරීමේ අවශ්‍යතා සමඟ වේගයෙන් කටයුතු කිරීමට හැකි වන පරිදි ව්‍යුහයක් මෙම අංශයට ඇතුළත් කර ඇත.

ස්ලීඩා විසින් රාජ්‍ය අංශයේ ආයතන සහ ඔවුන්ගේ කළමනාකරණ සේවකයින්ගේ නිපුණතා ගොඩනැගීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරයි.

1. අදාළ සේවා ව්‍යවස්ථාවලට අනුකූලව පහත සඳහන් දීප ව්‍යාප්ත සේවාවන්හි නව බඳවා ගැනීම් සඳහා සේවාරම්භක පුහුණුව. (ගාස්තු අය නොකරන වැඩසටහන්)
   (1) ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං. ප. සේ.)
   (2) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (ශ්‍රී ලං. ග. සේ.)
   (3) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය (ශ්‍රී ලං. ක්‍ර. සේ.)
   (4) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය (ශ්‍රී ලං. වි. සේ.)
   (5) ශ්‍රී ලංකා වාස්තු විද්‍යා සේවා (ශ්‍රී ලං. වා. වි. සේ.)
   (6) ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය (ශ්‍රී ලං. ඉං. සේ.)
   (7) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය (ශ්‍රී ලං. තො. තා. සේ.)

2. සියලුම දීප ව්‍යාප්ත සේවා නිලධාරීන්ගේ I ශ්‍රේණියේ සහ III ශ්‍රේණියේ මට්ටම්වල අනිවාර්ය ධාරිතා වර්ධන වැඩසටහන් (ගාස්තු අය නොකෙරෙන වැඩසටහන්)

3. ඩිප්ලෝමා වැඩසටහන් (ගාස්තු අයකරන)

4. කෙටිකාලීන පුහුණු වැඩසටහන් (ගාස්තු අය නොකෙරෙන වැඩසටහන්)

5. ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත පුහුණු වැඩසටහන් - රාජ්‍ය අංශයේ ආයතන සහ රාජ්‍ය ව්‍යවසායන් විසින් කරන ලද ඉල්ලීම් මත පදනම්ව (ගාස්තු අය කිරීමේ වැඩසටහන්)

6. කළමනාකරණ උපදේශන (ගාස්තු අය කරන)

7. වෙනත් පාඨමාලා (ගාස්තු අයකරන සහ ගාස්තු අය නොකරන වැඩසටහන්)

6.1.1. සේවාරම්භක පුහුණු වැඩසටහන්

දීප ව්‍යාප්ත සේවයට අලුතින් බඳවා ගන්නා අය සඳහා වන පුහුණු වැඩසටහන්, ඔවුන් වෙත පුළුල් පරාසයක විෂය කරුණු ඉදිරිපත් කිරීමට සහ සේවාවන්හි පෙර ගමන්කරුවන් ලෙස ලෙස කටයුතු කිරීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්පවලින් ඔවුන් සන්නද්ධ කිරීම උදෙසා පවත්වනු ලබයි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කෝවිඩ් -19 වසංගතය හේතුවෙන් ස්ලීඩා විසින් නිලධාරීන් 578 දෙනෙකු සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන් 05 ක් පවත්වා ඇති අතර, ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

අනු අංක	සේවාව	සහභාගි වූ පිරිස	2021.12.31 දිනට ප්‍රගතිය
01	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (විවෘත) සේවාරම්භක පුහුණු වැඩසටහන්	200	ක්‍රියාත්මක වෙමින් පවති
02	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (සීමිත) සේවාරම්භක පුහුණු වැඩසටහන්	52	ක්‍රියාත්මක වෙමින් පවති
03	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ (විවෘත සහ සීමිත) සේවාරම්භක පුහුණු වැඩසටහන්	144	ක්‍රියාත්මක වෙමින් පවති
04	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ II පංතියේ II ශ්‍රේණිය සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන්	61	ක්‍රියාත්මක වෙමින් පවති
05	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන්	121	කණ්ඩායම් 3 ක් අවසන් කර ඇත කණ්ඩායම් 1 ක් ක්‍රියාත්මක වෙමින් පවති
	මුළු ගණන	**578**	

6.1.2. දීප ව්‍යාප්ත සේවාවන් සඳහා අනිවාර්ය ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන්

දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප අඛණ්ඩව සංවර්ධනය කිරීම සිය මූලික වගකීමක් ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හඳුනාගෙන තිබේ.

දීප ව්‍යාප්ත සේවා වල සේවා ව්‍යවස්ථාවලට අනුව, මෙම සේවාවන්හි නිලධාරීන්ට සේවාරම්භක පුහුණුව සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් සම්පූර්ණ කිරීම අනිවාර්ය අවශ්‍යතාවයකි.

එබැවින්, කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවාවක් සහතික කිරීම සඳහා මෙම නිලධාරීන් අතර අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතියක් නිර්මාණය කිරීම අතිශයින් වැදගත් ය. ඒ අනුව, පහත සඳහන් සංකල්ප මත පදනම්ව දීප ව්‍යාප්ත සේවා නිලධාරීන් සඳහා පමණක් මෙම වැඩසටහන් පවත්වනු ලබයි:

- වරින් වර අවශ්‍ය විය හැකි, විශේෂයෙන් හඳුනාගත් වර්යාත්මක හා තාක්ෂණික නිපුණතා වැඩිදියුණු කිරීම

- සීඝ්‍රයෙන් වෙනස් වන පරිසරයක දිනෙන් දින ඉහළ යන අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා අඛණ්ඩව යාවත්කාලීන කිරීම හා වැඩිදියුණු කිරීම.

ඒ අනුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන් 1008 ක් සඳහා 2021 වර්ෂය තුළ සේවා නියුක්තික ධාරිතා සංවර්ධන වැඩසටහන් කිහිපයක් පවත්වා ඇති අතර, ඒවායේ තොරතුරු පහත දක්වා ඇත.

අනු අංක	සේවය	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව	2021.12.31 දිනට ප්‍රගතිය
1	ශ්‍රී ලං ප සේ I ශ්‍රේණිය	06	210	02 – අවසන් කර ඇත 04 – ක්‍රියාත්මක වෙමින් පවති
2	ශ්‍රී ලං ප සේ III ශ්‍රේණිය	08	328	07 – අවසන් කර ඇත 01 – ක්‍රියාත්මක වෙමින් පවති
3	ශ්‍රී ලං ග සේ III ශ්‍රේණිය	05	203	ක්‍රියාත්මක වෙමින් පවති
4	ශ්‍රී ලං තො ස තා සේ I පන්තිය	01	65	අවසන් කර ඇත
5	ශ්‍රී ලං තො ස තා සේ II පන්තිය - II ශ්‍රේණිය	04	202	අවසන් කර ඇත
	මුළු ගණන	**24**	**1008**	

6.1.3. නිපුණතා සංවර්ධන වැඩසටහන - ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය I, II සහ III ශ්‍රේණි

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, වාස්තු විද්‍යාත්මක සේවය යන සේවයන්හි (I, II සහ III ශ්‍රේණි) නිලධාරීන්ගේ කළමනාකරණ නිපුණතා සඳහා සැලසුම් කරන ලද මෙම වැඩසටහන මඟින් සේවා සම්පාදනයට අදාල දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම සහ වඩා හොඳ සේවාවක් සඳහා ධනාත්මක ආකල්ප වර්ධනය කිරීම පිළිබඳ පුළුල් දැනුමක් ලබාදීමයි.

වෘත්තිකයෙකු ලෙස කළමනාකරණ හා තාක්ෂණික අංශ දෙකටම නිරාවරණය වීමෙන් ඔවුන්ගේ වෘත්තීය නිපුණතාව සහ වෘත්තීය සංවර්ධනය වැඩි දියුණු කිරීමට අවස්ථාවක් ලබා දීම වෙනුවෙන් 2019 සහ 2021 යන වසර දෙකෙහි පැවැත්වූ මෙම පුහුණු වැඩසටහනට සහභාගී වූවන්ගේ මුළු සංඛ්‍යාව 441 කි. 2021 වර්ෂය තුළ දී පහත සඳහන් කණ්ඩායම් දෙක මෙම වැඩසටහන්වලට සහභාගී වී ඇත.

අනු අංක	කණ්ඩායම	තත්‍ය සහභාගී වූ සංඛ්‍යාව	2021.12.31 දිනට ප්‍රගතිය
1	1 කණ්ඩායම	34	අවසන් කර ඇත
2	2 කණ්ඩායම	29	අවසන් කර ඇත

6.2 කෙටි කාලීන පුහුණු වැඩසටහන්

සමාලෝචිත කාල සීමාව තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් කෙටි කාලීන පුහුණු වැඩසටහන් හතරක් පවත්වා ඇති අතර එහිදී නිලධාරීන් 148 දෙනෙකු පුහුණු කර ඇත.

6.3 ඩිප්ලෝමා වැඩසටහන්

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය (HNDIPPCA), කාර්යාල කළමනාකරණය (DOM), අභ්‍යන්තර විගණන ඩිප්ලෝමාව, ස්ලීඩා ඉංග්‍රීසි ඩිප්ලෝමාව සහ පරිපාලන නීතිය පිළිබඳ ඩිප්ලෝමාව යන ක්ෂේත්‍රවල ඩිප්ලෝමා වැඩසටහන් පවත්වයි.මෙම ඩිප්ලෝමා ඉතා ජනප්‍රිය වන අතර රාජ්‍ය අංශයේ කාර්යසාධනය වර්ධනය කිරීම සඳහා ඉතා වටිනා දායකත්වයක් ලබා දී ඇත.

පහත සඳහන් ඩිප්ලෝමා වැඩසටහන් 2021 දී පවත්වා ඇත.

අනු අංක	වැඩසටහනේ නම	සහභාගී වූ ප්‍රමාණය	2021.12.31 දිනට ප්‍රගතිය
1	රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව – 2020/2021	39	ක්‍රියාත්මක වෙමින් පවති
2	රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව- 2020/2021 (අහඹරුවාදා කණ්ඩායම A)	54	ක්‍රියාත්මක වෙමින් පවති
3	රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව- 2020/2021 (අහඹරුවාදා කාණ්ඩය B)	32	ක්‍රියාත්මක වෙමින් පවති
4	කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව - 2020/2021	34	ක්‍රියාත්මක වෙමින් පවති
5	පරිපාලන නීතිය පිළිබඳ ඩිප්ලෝමාව (සෙනසුරාදා)	38	අවසන් කර ඇත
6	අභ්‍යන්තර විගණනය පිළිබඳ ඩිප්ලෝමාව	24	ක්‍රියාත්මක වෙමින් පවති
	මුළු ගණන	**221**	

6.4 ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන්

සේවාදායක ආයතන විසින් කරන ලද ඉල්ලීම්වලට සරිලන පරිදි මෙම වැඩසටහන් විශේෂයෙන් නිර්මාණය කර ඇත. 2021 දී ශ්‍රී ලං. සං. ප. ආයතනය විසින් පුහුණු වැඩසටහන් 14 ක් පවත්වා ඇති අතර රාජ්‍ය අංශයේ ආයතනවල ඉල්ලීම පරිදි නිලධාරීන් 376 දෙනෙකු පුහුණු කර ඇත. පහත සඳහන් ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත වැඩසටහන් 2021 දී පවත්වා ඇත.

අනු අංක	සේවාදායක ආයතනය	ඉල්ලුම් ප්‍රකාරව සම්පාදිත පුහුණු ක්ෂේත්‍රය	සහභාගී වූ සංඛ්‍යාව
1	ජාතික පොහොර ලේකම් කාර්යාලය	උසස්වීම් ලැබූ සහකාර අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණු වැඩසටහන	26
2	ජාතික පොහොර ලේකම් කාර්යාලය	උසස්වීම් ලැබූ සහකාර අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණු වැඩසටහන	28
3	ජාතික පොලිස් ඇකඩමිය	අලුතින් උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන් සඳහා කළමනාකරණ සහ සංවර්ධන පුහුණු වැඩසටහන	38
4	ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය	රාජ්‍ය මූල්‍ය සහ රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණ මොඩියුලය 26 වැනි ලොජිස්ටික් උප ලුතිනන් තාක්ෂණික පාඨමාලාව	22
5	ජාතික පොලිස් ඇකඩමිය	අලුතින් උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන් සඳහා කළමනාකරණ සහ සංවර්ධන පුහුණු වැඩසටහන (කණ්ඩායම 2)	31
6	ජාතික පොලිස් ඇකඩමිය	අලුතින් උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන් සඳහා කළමනාකරණ සහ සංවර්ධන පුහුණු වැඩසටහන (කණ්ඩායම 1)	38
7	ජාතික පොලිස් ඇකඩමිය	අලුතින් උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන් සඳහා කළමනාකරණ සහ සංවර්ධන පුහුණු වැඩසටහන (3 කණ්ඩායම)	35
8	සිවිල් ගුවන් සේවා අධිකාරිය	කළමනාකරණය සහ නායකත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	12
9	ජාතික පොලිස් ඇකඩමිය	අලුතින් උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන් සඳහා කළමනාකරණ සහ සංවර්ධන පුහුණු වැඩසටහන	47
10	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ධාරිතා වර්ධන වැඩසටහන	30
11	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	මධ්‍යම සංස්කෘතික අරමුදලේ සහ ජාතික චිත්‍රපට සංස්ථාවේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන	35
12	විශේෂ කාර්ය බළකා පුහුණු පාසල	සන්නිවේදනය සහ ඉදිරිපත් කිරීමේ කුසලතා පිළිබඳ වැඩමුළුව	15
13	මානුෂික සමාජගත කිරීමේ කාර්යාලය	ආබාධිත ජාත්‍යන්තර සම්මේලනය වැඩසටහන	10
14	වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය	වෛද්‍ය විද්‍යාව හදාරන හමුදා නිලධාරීන් සඳහා කළමනාකරණ සහ නායකත්ව වැඩමුළුව	9

6.5 කළමනාකරණ උපදේශන

රාජ්‍ය අංශයේ ආයතන සඳහා කළමනාකරණ උපදේශන සැපයීමට ස්ලීඩා ආයතනයෙහි ඉගෙනුම් හා සංවර්ධන අංශය දායක විය. සාමාන්‍යයෙන් මෙම උපදේශන, සේවක සංඛ්‍යාව, ක්‍රියාවලීන්, වැඩ ප්‍රමාණය තක්සේරු කිරීම, අත්පොත් සහ මාර්ගෝපදේශ, සංයුක්ත සැලසුම්, ආයතනික සැලසුම්, මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ කාර්ය සාධනය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලසුම් යනාදිය සමාලෝචනය කිරීම සඳහා සිදු කරනු ලබයි. පහත සඳහන් ආයතනික සංවර්ධන සේවාවන් 2021 දී ස්ලීඩා ආයතනය විසින් සපයන ලදී.

- විශ්වාස මට්ටමේ රක්ෂණය පිළිබඳ සමීක්ෂණය - ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
- මාන්තායි ලුණු සමාගම සඳහා විනය සංග්‍රහය / ආචාර ධර්ම සංග්‍රහය සකස් කිරීම
- පරිසර සංවේදී ප්‍රදේශ පිළිබඳ පුහුණු මොඩියුල සකස් කිරීම - පරිසර අමාත්‍යාංශයේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසවහන මගින් අරමුදල් ව්‍යාපෘතිය
- පුහුණු මොඩියුල සංවර්ධනය - උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය

7. පශ්චාත් උපාධි අධ්‍යයන පාසල (SPS)

1985 අංක 7 දරන පනත මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 (අ) වගන්තිය යටතේ වූ නියෝගය ප්‍රකාරව 2003 වර්ෂයේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලං. සං. ප. ආයතනයට ශාස්ත්‍රපති මට්ටමේ උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය පිරිනමා ඇත. ඒ අනුව පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය පිහිටුවන ලද අතර, පසුව ජාතික, ප්‍රාදේශීය හා ජාත්‍යන්තර මට්ටමින් රාජ්‍ය අංශයේ වෘත්තිකයන් සමඟ අඛණ්ඩව සම්බන්ධ වී කටයුතු කරන ලදී. මෙම ශාස්ත්‍රපති උපාධි වැඩසටහන පෞද්ගලික අංශයට ද විවෘත වන අතර සතියේ දිනවල මෙන්ම සති අන්තයේ දිනවල ද පාඨමාලා පැවැත්වෙන බැවින් එය සන්නද්ධ හමුදා, පොලිස් සහ සෞඛ්‍ය අංශයේ සේවකයින් අතර ද වඩාත්ම ඉල්ලුමට ලක් වූ වැඩසටහනක් බවට පත් වී ඇත. අමාත්‍යාංශ ලේකම්වරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් සිය කළමනාකරුවන් වෙතින් සුවිශේෂ දායකත්වයක් අපේක්ෂා කරන්නා වූත් වේගයෙන් වෙනස් වන හා අභියෝගාත්මක පරිසරයක් පසුබිම් කොටගෙන මෙම රාජ්‍ය කළමනාකරණපති උපාධි පාඨමාලාව හදුන්වා දී ඇත. මෙම සුවිශේෂ වැඩසටහන මගින් ශාස්ත්‍රපති උපාධියක් ලබා ගැනීම සඳහා එහි අධ්‍යයන සාමාජිකයින් හට පහසුකම් සලසන අතර විවිධ කළමනාකරණ මට්ටම්වල විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීමට සහ කුසලතා වර්ධනය කරගැනීමේ ලා උපකාරී වේ.

පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය මගින් ලබාදෙනු ලබන රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව රටේ ප්‍රමුඛතම ප්‍රායෝගික පශ්චාත් උපාධි පාඨමාලාවන්ගෙන් එකකි. මේ අනුව, පාඨමාලාවට අයදුම්කර ඇති අයගෙන් සුදුස්සන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය, පාඨමාලාවේ අන්තර්ගතය සහ ඉගෙනුම් අත්දැකීම ලබාදෙන විලාසය පිළිබඳ සලකා බැලීමේදී මෙම පාඨමාලාව වෙනත් සමාන පාඨමාලාවලට වඩා වෙනස් වන අතර තම ක්ෂේත්‍රයට අදාළ ප්‍රායෝගික අත්දැකීම ලබා ගැනීමට කටයුතු සම්පාදනය කර ඇත.



රාජ්‍ය කළමනාකරණපති (MPM) වැඩසටහන සඳහා මේ දක්වා ලියාපදිංචි වී ඇති සංඛ්‍යාව

2021 වසර ආරම්භයේදී, පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය විසින් 2020-2022 කණ්ඩායම බඳවා ගැනීමේ සමාරම්භක උත්සවය 2021 ජුනි 28 වන දින සංවිධානය කරන ලද අතර එහිදී අපේක්ෂකයින් 50 දෙනෙකු ලියාපදිංචි විය. 2021 වසර තුළදී, පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය විසින් සම්පූර්ණ අධ්‍යයන සාමාජිකයින් 217 ක් සමඟ රාජ්‍ය කළමනාකරණපති (MPM) වැඩසටහනෙහි සමාන්තර කණ්ඩායම් තුනක් පවත්වා ගෙන ගොස් ඇත.

උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් දැනුම නිර්මාණය කිරීම, යෙදීම, සංරක්ෂණය සහ බෙදා හැරීම සඳහා කැපවෙමින්, පශ්චාත් උපාධි අධ්‍යයන පාසල විසින් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ සහභාගිවන්නන් සඳහා කාලෝචිත වැදගත් මාතෘකා පිළිබඳව සාකච්ඡා සහ ආරාධිත දේශන කිහිපයක් සංවිධානය කර ඇත.

රාජ්‍ය කළමනාකරණපති පාඨමාලා සහභාගිවන්නන් සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට දැනුම සැපයීමේ අරමුණ ඇතිව, ස්ලීඩා හි පශ්චාත් උපාධි අධ්‍යයන පාසල ශ්‍රී ලංකාවේ විධායක නිලධාරීන්ගේ කළමනාකරණ හැකියාව ඉහළ නැංවීමේ අරමුණින් දේශීය හා ගෝලීය වශයෙන් වැදගත් කාලීන මාතෘකා පිළිබඳ මහජන දේශන සංවිධානය කරයි. පහත දැක්වෙන්නේ පශ්චාත් උපාධි පාසල විසින් පවත්වන ලද ආරාධිත දේශන මාලාවයි.

- මැක්සන්ස් හෝල්ඩින්ස් හි සමූහ සාමාන්‍යාධිකාරී ආචාර්ය අලි අහ්ලාම් නවාස් විසින් 2021 සැප්තැම්බර් 04 වන දින "රාජ්‍ය - දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් පුද්ගලික අංශයන්හි මහජන කටයුතු කළමනාකරණය" යන මැයෙන් මහජන දේශනයක් පවත්වන ලද අතර ඊට විශාල පිරිසක් සහභාගී වූහ.

- ලෝක බැංකුවේ ජ්‍යෙෂ්ඨ උපදේශක ආචාර්ය ගාමිණී බටුවිටගේ විසින් 2021 සැප්තැම්බර් 11 වැනි දින ‘‘යහපාලනයේ මූලධර්ම ලෙස කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය: ශ්‍රී ලංකාවට පාඩම්’’ යන මැයෙන් මහජන දේශනයක් පවත්වන ලද අතර ඊට විශාල පිරිසක් සහභාගි වූහ.

- ජැමෙයිකාවේ තාක්ෂණ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ හිටපු පීඨාධිපති ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා විසින් 2021 සැප්තැම්බර් 25 වැනි දින ‘‘මානව හිමිකම් සහ රාජ්‍ය අංශයට එහි ප්‍රතිවිපාක’’ මැයෙන් අන්තර්ජාලය ඔස්සේ මහජන දේශනයක් පවත්වන ලද අතර එයට විශාල පිරිසක් සහභාගී විය.

- ලෝක බැංකුවේ ජ්‍යෙෂ්ඨ උපදේශක ආචාර්ය ගාමිණී බටුවිටගේ විසින් 2021 ඔක්තෝම්බර් 09 වැනි දින ‘‘සමාජ ප්‍රාග්ධනය: සිවිල් සමාජය, පුරවැසියන්ගේ භූමිකාවන්, අයිතිවාසිකම් සහ වගකීම්’’ යන මැයෙන් මහජන දේශනයක් පවත්වන ලද අතර ඊට විශාල පිරිසක් සහභාගි වූහ.

8. 2021 වසර තුළ පවත්වන ලද විභාග

ශ්‍රී ලං. ස. ප ආයතනයේ විභාග අංශය විසින් 2021 වර්ෂය තුළ විභාග 31ක් පවත්වා ඇති අතර ඉන් 19ක් බාහිර සංවිධාන සඳහා වූ අතර ඉතිරිය අභ්‍යන්තර වැඩසටහන් සඳහා වේ.
බාහිර විභාගවලට බඳවා ගැනීමේ විභාග, කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අභ්‍යන්තර උසස්වීම් විභාග ඇතුළත් විය. සමාලෝචනයට ලක්වන කාල සීමාව තුළ පහත සඳහන් බාහිර සහ අභ්‍යන්තර විභාග ශ්‍රී ලං. ස. ප ආයතනය විසින් පවත්වන ලදී.
කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද වසර පුරා සැලකිය යුතු විභාග ප්‍රමාණයක් පැවැත්වීමට ශ්‍රී ලං. ස. ප ආයතනයේ විභාග අංශයට හැකි විය.

2021 වසර තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වන ලද විභාග

අභ්‍යන්තර විභාග

අනු අංක	දෙපාර්තමේන්තුව	විභාගයේ නම	අපේක්ෂකයින් ගණන
1	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDIPPCA) - 3 වැනි අධ්‍යයන වාර විභාගය	116
2	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDIPPCA) - 3 වැනි අධ්‍යයන වාර විභාගය	81
3	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDIPPCA) - 3 වැනි අධ්‍යයන වාර විභාගය	124
4	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDIPPCA) - නැවත විභාගය	04
5	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	ස්ලීඩා සහතික කළ රියදුරන් සඳහා විභාගය	02
6	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	කාර්යාල කළමනාකරණය පිළිබඳ ස්ලීඩා ඩිප්ලෝමාව	33
7	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	අභ්‍යන්තර විගණනය පිළිබඳ ඩිප්ලෝමාව - 1 වන අධ්‍යයන වාරයේ විභාගය	23
8	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	වැඩසටහන් නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා තේරීම් තරඟ විභාග	3
9	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	ද්විතීයන පදනම මත කළමනාකරණ සහකාර තනතුරට බඳවා ගැනීම සඳහා තේරීම් තරඟ විභාග	60
10	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	ගබඩා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව	42
11	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	රාජ්‍ය කළමනාකරණපති පාඨමාලාව 2018-2020 VI අධ්‍යයන වාරය විභාගය	64
12	ශ්‍රී.ලං.සං.ප. ආයතනය	රාජ්‍ය කළමනාකරණපති පාඨමාලාව 2019-2021 අධ්‍යයන වාරය I	97

බාහිර විභාග

අනු අංක	දෙපාර්තමේන්තුව	විභාගයේ නම	අපේක්ෂකයින් ගණන
01	ආරක්ෂක අමාත්‍යාංශය	II ශ්‍රේණියේ සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලන නිලධාරීන් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	6
02	කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා	නීති නිලධාරි සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
03	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව	රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
04	අධ්‍යාපන අමාත්‍යාංශය	නීති නිලධාරි තනතුර සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
05	පරිසර අමාත්‍යාංශය	විධායක නිලධාරී සේවා ශ්‍රේණිය/සහකාර අධ්‍යක්ෂ (I ශ්‍රේණිය) සඳහා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
06	වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව	නීති නිලධාරි තනතුර සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
07	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	නිෂ්පාදන සහකාර/ලේඛන සහකාර තනතුර සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	18
08	හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	සහකාර භාරකරු සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
09	රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය සඳහා බඳවා ගැනීමේ විභාගය (විවෘත) - 2020	3267
10	වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය	පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	73
11	කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවය	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා කාණ්ඩය 2 සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	5
12	පරිසර අමාත්‍යාංශය	විධායක නිලධාරී සේවා ශ්‍රේණිය/සහකාර අධ්‍යක්ෂ (II ශ්‍රේණිය) සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	2

13	රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය	ශ්‍රී ලංකා පරිපාලන සේවය සඳහා දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පරිගණක ප්‍රායෝගික පරීක්ෂණය	165
14	අමාත්‍ය මණ්ඩල කාර්යාලය	විධායක නිලධාරී II ශ්‍රේණිය සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1
15	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ විධායක සේවා කාණ්ඩයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	3
16	ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය	සංවර්ධන නිලධාරී, සංවර්ධන සහකාර, සංවර්ධන සම්බන්ධීකාරක තනතුරු සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	12
17	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව	විධායක සේවා කාණ්ඩයේ (නීති නිලධාරී) නිලධාරීන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	2
18	විදුලිබල අමාත්‍යාංශය	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - III ශ්‍රේණිය	1
19	පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව	සහකාර කොමසාරිස් (තාක්ෂණ) සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය	1

9. තොරතුරු තාක්ෂණය සඳහා වන මධ්‍යස්ථානය

තොරතුරු තාක්ෂණය සඳහා වන මධ්‍යස්ථානයේ අරමුණ වන්නේ පුහුණු සහ උපදේශන සේවා හරහා රාජ්‍ය අංශයේ ආයතනවලට ඔවුන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හැකියාවන් වර්ධනය කර ගැනීමට සහාය වීමය. මෙම වසර තුළ, මධ්‍යස්ථානය විසින් සේවාරම්භක සහ ධාරිතා සංවර්ධන අරමුණු සඳහා වැඩසටහන් 13 ක් පවත්වන ලදී. මාර්ගගත විභාග 09 ක් ද පවත්වන ලදී. මෙම වැඩසටහන් මාර්ගගත තාක්ෂණය යොදාගෙන සිදු කරන ලදී. සෞඛ්‍ය අධිකාරීන් විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුගමනය කරමින් "නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමවේදයට (WFH)" අනුව සලසා තිබූ විධිවිධානයන්ට අනුකූලව පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මයික්‍රොසොෆ්ට් සමාගම විසින් තාක්ෂණික යටිතල පහසුකම් ඉහල නැංවීම, දේශීය නියෝජිතයන්ගේ සහය මත නොමිලයේ සිදු කරන ලදී. මීට අමතරව, මධ්‍යස්ථානය විසින් සේවා සපයන්නන්ගේ සේවා තත්ත්වය ඉහළ නැංවීම සඳහා මෘදුකාංග විසඳුම් හතක් ද ක්‍රියාත්මක කරන ලදී.

2021 ජනවාරි - සැප්තැම්බර් කාලය තුළ පවත්වන ලද සේවාරම්භක හා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන්

අනු අංක	වැඩසටහනේ නම	දින ගණන	ඉලක්කගත වැඩසටහන් ගණන	පවත්වන ලද වැඩසටහන් ගණන	සහභාගී වූ ගණන	සහභාගිවන්නන්ගේ දින ගණන
1	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා **2** පන්තියේ **II** ශ්‍රේණිය (**2** කාණ්ඩය) සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන - මාර්ගගත **2021**	**20**	**01**	**01**	**36**	**720**
2	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා **2** පන්තියේ **II** ශ්‍රේණිය (**2** කාණ්ඩය) සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන - මාර්ගගත **2021**	**20**	**01**	**01**	**58**	**1160**
3	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා **2** පන්තියේ **II** ශ්‍රේණිය (**2** කාණ්ඩය) සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන - මාර්ගගත **2021**	**20**	**01**	**01**	**43**	**860**
4	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාව සඳහා ධාරිතා	**20**	**01**	**01**	**65**	**1300**

	සංවර්ධන වැඩසටහන 2 ශ්‍රේණිය II (2 කාණ්ඩය) - මාර්ගගත 2021					
5	ශ්‍රී ලංකා පරිපාලන සේවා III පන්තියේ 2012 කාණ්ඩයේ H කාණ්ඩය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන	03	01	01	40	120
6	ශ්‍රී ලංකා පරිපාලන සේවා III පන්තියේ 2012 කාණ්ඩයේ G කාණ්ඩය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන	03	01	01	40	120
7	2012 කාණ්ඩයේ ශ්‍රී ලංකා පරිපාලන සේවා III කාණ්ඩයේ F කාණ්ඩය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන	03	01	01	44	132
8	2012 කාණ්ඩයේ ශ්‍රී ලංකා පරිපාලන සේවා III කාණ්ඩයේ E කාණ්ඩය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන	03	01	01	44	132
9	ශ්‍රී ලංකා පරිපාලන සේවා III පන්තියේ 2012 කාණ්ඩයේ D කාණ්ඩය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන	03	01	01	30	90
10	ශ්‍රී ලංකා පරිපාලන සේවා සීමිත කණ්ඩායම සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන - 2021 තොරතුරු සැකසීම සහ විශ්ලේෂණය පිළිබඳ මොඩියුලය	02	01	01	52	104
11	ශ්‍රී ලංකා පරිපාලන සේවය සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන විවෘත කණ්ඩායම – මාර්ගගත 2021 (C & D කාණ්ඩය) ICT හඳුන්වාදීම සහ ඉ-රාජ්‍ය සංකල්පය ක්‍රියාත්මක කිරීම පිළිබඳ මොඩියුලය	05	01	01	39	195

12	ශ්‍රී ලංකා පරිපාලන සේවය සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන - සීමිත **2021** **ICT** යෙදුම් සහ ඉ- රාජ්‍ය මොඩියුලය	**02**	**01**	**01**	**57**	**114**
13	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාව සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන - **II** පන්තිය- **II** ශ්‍රේණිය විවෘත සහ සීමිත (කාණ්ඩ **02**)	**11**	**01**	**01**	**28**	**308**
14	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන - **II** පන්තිය- **II** ශ්‍රේණිය විවෘත සහ සීමිත (කාණ්ඩ **03**)	**11**	**01**	**01**	**32**	**352**
15	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය **1** පන්තිය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන - **1** කණ්ඩායම	**14**	**01**	**01**	**57**	**798**
	මුළු ගණන	140	15	15	655	**6505**

2021 ජනවාරි - සැප්තැම්බර් කාලය තුළ මාර්ගගතව පවත්වන ලද විභාග

අනු අංක	විභාග	අපේක්ෂකයින් සංඛ්‍යාව
1	**SCDL** විභාග දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය - හම්බන්තොට ශ්‍රී ලංකා පරිපාලන සේවා පන්තිය **III** සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන	26
2	ශ්‍රී ලංකා පරිපාලන සේවා පන්තිය **III** සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන ශ්‍රී ලං ප සේ **III** 2012 **CBP** කාණ්ඩය **D** සඳහා ඉ-රාජ්‍ය හා ආරක්ෂාව මොඩියුල විභාගය	30
3	ශ්‍රී ලංකා පරිපාලන සේවා පන්තිය **III** සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන ශ්‍රී ලං ප සේ **III 2012 CBP** කාණ්ඩය **E** සඳහා ඉ-රාජ්‍ය හා ආරක්ෂාව මොඩියුල විභාගය	44

4	ශ්‍රී ලංකා පරිපාලන සේවා පන්තිය **III** සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන ශ්‍රී ලං ප සේ **III 2012 CBP** කාණ්ඩය **F** සඳහා ඉ-රාජ්‍ය හා ආරක්ෂාව මොඩියුල විභාගය	44
5	ශ්‍රී ලංකා පරිපාලන සේවා පන්තිය **III** සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන ශ්‍රී ලං ප සේ **III 2012 CBP** කාණ්ඩය **G** සඳහා ඉ-රාජ්‍ය හා ආරක්ෂාව මොඩියුල විභාගය	40
6	ශ්‍රී ලංකා පරිපාලන සේවා පන්තිය **III** සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන ශ්‍රී ලං ප සේ **III 2012 CBP** කාණ්ඩය **H** ඉ-රාජ්‍ය හා ආරක්ෂාව මොඩියුල විභාගය	**40**

10. භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය

ශ්‍රී ලං.සං.ප. ආයතනයෙහි භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය, ප්‍රධාන වශයෙන් රාජ්‍ය සේවකයින් සඳහා රාජ්‍ය භාෂා සහ සම්බන්ධීකරණ භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය වර්ධනය කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වැඩසටහන් පවත්වයි. දීප ව්‍යාප්ත සේවාවන්හි බඳවා ගැනීමේ පුහුණු වැඩසටහන් සඳහා සහභාගිවන්නන් සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් රාජ්‍ය භාෂා වැඩසටහන් (සිංහල සහ දෙමළ) පවත්වනු ලැබේ.

ඉංග්‍රීසි, දෙමළ සහ සිංහල භාෂාවලින් රාජ්‍ය නිලධාරීන්ගේ භාෂා කුසලතා සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම සඳහා පහත සඳහන් පාඨමාලා පවත්වන ලද අතර, 2021 වර්ෂය තුළ නිලධාරීන් හාරසිය අනූ හතක් (497) සහභාගි වූහ.

- ස්ලීඩා ඉංග්‍රීසි ඩිප්ලෝමාව
- රැකියා අරමුණු සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් සහතිකපත්‍ර පාඨමාලාව
- සේවාරම්භක පුහුණු වැඩසටහන් සඳහා ඉංග්‍රීසි සහ රාජ්‍ය භාෂා පාඨමාලා (වසංගත තත්ත්වය හේතුවෙන් නිල කාලසටහන වෙනස් කිරීම හේතුවෙන් ශ්‍රී ලං. ප. සේ 2021 (විවෘත) කණ්ඩායම සඳහා නිල භාෂා පාඨමාලාව කල් දැමීමට සිදු විය)
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා ඔවුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහනේ ඉංග්‍රීසි භාෂාව සහ සන්නිවේදන නිපුණතාව.

11. සාමාන්‍ය පරිපාලනය

11.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

11.1.1. 2021.12.31 දිනට සේවක සංඛ්‍යා පිළිබඳ තොරතුරු

	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	47	24	23
තෘතීයික	24	13	11
ද්විතීයික	54	42	12
ප්‍රාථමික	41	30	11
මුළු ගණන	**166**	**109**	**57**

11.2 මානව සම්පත් කළමනාකරණය

11.2.1. ද්විතීයන හා ස්ථිර පදනම මත පහත සඳහන් තනතුරු පුරප්පාඩු පුරවා ඇත.

අනු අංක	තනතුර	පුරවන ලද තනතුරු සංඛ්‍යාව	බඳවා ගත් පදනම
01	ජ්‍යෙෂ්ඨ උපදේශක	04	ද්විතීයන
02	අධ්‍යක්ෂ(මුදල්)	01	ද්විතීයන
03	වැඩසටහන් නිලධාරී	02	ද්විතීයන ස්ථිර
04	කළමනාකරණ සහකාර	03	ද්විතීයන
05	රියදුරු	01	ද්විතීයන

11.2.2. විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම, ස්ථාන මාරුවීම් සහ ද්විතීයන කාල සීමාව අවසන් වීම හේතුවෙන් පහත තනතුරු පුරප්පාඩු විය.

අනු අංක	තනතුර	පුරප්පාඩු සංඛ්‍යාව	පුරප්පාඩු වීමට හේතු
01	ජ්‍යෙෂ්ඨ උපදේශක	01	ස්ථාන මාරු
02	අධ්‍යක්ෂ(මුදල්)	01	ස්ථාන මාරු
03	තොරතුරු තාක්ෂණ ප්‍රදර්ශක	01	ඉල්ලා අස්වීම
04	වැඩසටහන් නිලධාරී	01	ස්ථාන මාරු
05	කළමනාකරණ සහකාර	03	**ඉල්ලා අස්වීම**

11.3 සැපයුම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ පහත සඳහන් පිරිවිතර නවීකරණය කර ඇත.

අනු අංකය	ප්‍රසම්පාදන වර්ගය	ඇස්තමේන්තු පිරිවැය (රු.මිලියන)	තථ්‍ය පිරිවැය (රු.)
1	හානියට පත් ආයතනික තාප්පය ප්‍රතිසංස්කරණය කිරීම (I කොටස)	2.40	812,596.00
2	ජල බෝතල් පිරවුම් කාමරය අලුත්වැඩියා කිරීම	0.29	286,065.70
3	සංවදනී දේශන ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම	1.06	951,707.91
4	අධ්‍යනේන්ද්‍රිය නවීකරණය කිරීම	0.86	853,298.31
5	සංහිද ශාලාවේ වේදිකාව ප්‍රතිසංස්කරණය කිරීම	0.85	756,972.00
6	නුවරඑළිය සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම	0.14	139,183.15
7	ගෘහ භාණ්ඩ අත්පත් කර ගැනීම	1.66	1,597,336.60
8	පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, බහුමාධ්‍ය, බාහිර දෘඪ තැටි ආදිය සැපයීම සහ ස්ථාපනය කිරීම.		
*	බාහිර දෘඪ තැටිය (02)	1.10	21,900.00
*	බහුකාර්ය මුද්‍රණ යන්ත්‍ර (02)		918,000.00
*	ෆැක්ස් සහිත බහුකාර්ය මුද්‍රණ යන්ත්‍රය (01)		41,040.00
*	තීත් න්‍යාස මුද්‍රණ යන්ත්‍රය (01)		43,500.00
*	දූරකථන (15)		37,425.00
*	ඩිජිටල් දූරකථන (02)		63,720.00
*	වයි-ෆයි රවුටර් (03)		5,970.00

9	පොත් සහ විද්‍යුත් ද්‍රව්‍ය මිලදී ගැනීම	0.10	99,404.50
10	ජල බොයිලේරු මිලදී ගැනීම ආදිය	0.29	286,200.00
11	වායු සමීකරණ යන්ත්‍ර, විදුලි පංකා යනාදිය සැපයීම සහ ස්ථාපනය කිරීම.	2.00	175,500.00
12	විවිධ		
*	සීනු (4)	0.30	27,600.00
*	වෙබ් කැමරා (16)		55,200.00
*	හඬ පටිගත කරන උපකරණ (2)		54,800.00
*	ජල බෙදන යන්ත්‍ර (අංක 04)		81,396.00
*	මයික්‍රෆෝන හා උපාංග		16,400.00
*	ඩිජිටල් උෂ්ණත්වමාන (2)		21,840.00
		11.05	**7,347,055.17**

12. පුස්තකාල හා තොරතුරු සේවා- ආචාර්ය එච්.එස්. වනසිංහ පුස්තකාලය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුස්තකාලය, පුහුණුව සඳහා සහභාගී වන රාජ්‍ය / පෞද්ගලික අංශයේ විධායක නිලධාරීන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා සහාය වේ. පුස්තකාලය තුළ රාජ්‍ය පරිපාලන විෂයය ක්ෂේත්‍රවලට අදාළව, විශේෂයෙන්ම උපයෝජකයින්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා කළමනාකරණ ක්ෂේත්‍රයේ පුළුල් පරාසයකට අයත් නව පොත් රාශියකින් සමන්විතය. නව පුහුණු පාඨමාලා හඳුන්වාදීම, පවතින පාඨමාලා යාවත්කාලීන කිරීම සහ උපදේශන හා පර්යේෂණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා පුස්තකාලය සම්බන්ධ වී සිටින අතර, අවශ්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට පහසුකම් සපයයි.

<u>ආවරණය කරනු ලබන විෂයය ක්ෂේත්‍ර</u>

රාජය ප්‍රතිපත්ති, යහපාලනය, පුද්ගල සංවර්ධනය, ආර්ථික සංවර්ධනය හා සැලසුම් කිරීම, ඵලදායිතාව, පාරිසරික කළමනාකරණය, කාර්ය සාධන සංවර්ධනය, ගෝලීයකරණය, ව්‍යාපෘති කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, තිරසාර සංවර්ධනය, පෞද්ගලීකරණය, ඉ- රාජ්‍යය සහ ඉ-ව්‍යාපාර යන ක්ෂේත්‍රයන්ට අදාළ ග්‍රන්ථ එකතුවක් පුස්තකාලය සතුව පවතී.

<u>පුස්තකාලය මඟින් සපයන සේවා</u>

සඳුදා සිට සෙනසුරාදා දක්වා පෙ.ව.8.30 සිට ප.ව. 5.00 දක්වා උපයෝජකයින් සඳහා පුස්තකාලය විවෘතව පවතී. ඉගැන්වීම්, ඉගෙනුම් සහ පර්යේෂණ කටයුතු සඳහා උපකාරී වන අතර පුස්තකාලය පිළිබඳ තොරතුරු මාර්ගගත දත්ත ගබඩාවෙන් ද පුස්තකාල මාර්ගෝපදේශ සහ නියමු ලේඛල වැනි මෙවලම් ඔස්සේ මෙන්ම පුස්තකාල කාර්ය මණ්ඩලයේ සහයෙන් ද ලබාගත හැකිය.

මෙයට අමතරව, පෞද්ගලික අධ්‍යයන කටයුතු සඳහා පුස්තකාලය භාවිතා කරන්නන් හට ලැප්ටොප් පරිශීලනය, විද්‍යුත් මුද්‍රණ සේවා සඳහා පහසුකම් සපයා ඇත. පුස්තකාලයේ නොමැති පොත් සහ වාර සඟරා වෙනත් පුස්තකාලවලින් අන්තර් පුස්තකාල පිරුළු සේවාව (Inter Library Loan) හරහා ලබා ගැනෙයි. තොරතුරු සම්පත්වල ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා නිරීක්ෂණ කැමරා සවි කර ඇති අතර ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් අවශ්‍ය මුද්‍රණ කටයුතු මනා ගුණාත්මකභාවයකින් හා කාර්යක්ෂමතාවකින් සිදු කෙරේ.

<u>සාමාජිකත්වය සහිතව පුස්තකාලය පරිහරණය කරන්නන්</u>

2020 මාර්තු මාසයේ සිට රට තුළ ඇති වූ කොරෝනා වසංගතය හේතුවෙන් ආයතනයේ පාඨමාලා ද සීමා කරන ලද අතර පුස්තකාල ප්‍රවේශය ද සීමා කෙරිණි. පුස්තකාලය විවෘතව තිබුණේ ආයතනයේ කාර්ය මණ්ඩලයට පමණි.

සාමාජිකත්වය රහිතව පුස්තකාලය පරිහරණය කිරීම

සාමාජිකත්වය නොමැතිව පුස්තකාල භාවිතය මේ වසරේ කෙටිකාලීන පාඨමාලා සඳහා පමණක් සීමා වූ බැවින් පුස්තකාල භාවිතය සීමා විය.

පුස්තකාලයට තොරතුරු සම්පත් අත්පත් කර ගැනීම

පරිත්‍යාග ලෙස ලැබුණු පොත් සංඛ්‍යාව පහත පරිදි වේ.

- අනුග්‍රහ ලෙස ලැබුණු - 36
- විශේෂ පරිත්‍යාග - 10

2021 වර්ෂයේ දී පුස්තකාලයේ තොරතුරු සම්පත් ලබා ගැනීමේ මුළු පිරිවැය පහත පරිදි වේ.

මිළදී ගත් අයිතම	පිරිවැය
ග්‍රන්ථ	126,875.00
වාර ප්‍රකාශන(දේශීය)	1,800.00
වාර ප්‍රකාශන(විදේශීය)	-
පුවත්පත්	167,070.00
මුළු	**295,745.00**

මේ වසරේ නොවැම්බරයේදී පුස්තකාල පොත් සමීක්ෂණය ආයතනයේ පාලන අංශය විසින් පවත්වන ලදී.

13. 2021 වසර තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විශේෂ සිදුවීම්

13.1. රාජ්‍ය සේවයේ කළමනාකරණ නොවන කාණ්ඩයේ කාර්ය මණ්ඩලය සඳහා ඉගෙනුම් සහ සංවර්ධන මුලපිරීම් ශක්තිමත් කිරීම.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, රාජ්‍ය සේවයේ කළමනාකරණ නොවන කාණ්ඩයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ ධාරිතා සංවර්ධනය සඳහා ඉගෙනුම් සහ සංවර්ධන මුලපිරීම් ශක්තිමත් කිරීමට කාලෝචිත පියවර ගෙන ඇත.

පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ සහ කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක (MDTUs) අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වයෙන් 2021 පෙබරවාරි 2 වන දින ශ්‍රී ලං. සං. ප. ආයතනයෙහි විශේෂ රැස්වීමක් පැවත්වුණි. මෙම රැස්වීමට රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ජේ.ජේ. රත්නසිරි මහතාද සහභාගි විය. රාජ්‍ය සේවයේ මානව සම්පත් සංවර්ධනය ඉහළ නැංවීමේ අවශ්‍යතාවය වෙනුවෙන් පැවති මෙම සාකච්ඡාවේදී ඒ සඳහා ශ්‍රී ලං. සං. ප ආයතනය විසින් ගන්නා උත්සාහය සාර්ථක වනු ඇතැයි ලේකම් විසින් අවධාරණය කළේය. අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ප්‍රදීපා සේරසිංහ මහත්මිය රැස්වීම මෙහෙය වූ අතර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන/කළමනාකරණ නොවන පුහුණු) ඩී. විජේකෝන් මහතා මෙම අවස්ථාවට පහසුකම් සපයන ලදී.ආරාධිතයින් විසින් පළාත් මට්ටමින් ගුණාත්මක හා ඵලදායී කළමනාකරණ නොවන පුහුණුවක් සංවර්ධනය කිරීම සහ ලබා දීම සඳහා ශ්‍රී ලං. සං. ප. ආයතනය වෙතින් සෘජු පහසුකම් අපේක්ෂා කරන ලදී.



13.2. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය සමඟ 2021 පෙබරවාරි 9 වැනි දින ශ්‍රී ලං. සං. ප. ආයතනයේදී අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය යනු රටේ පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ අන්‍යෝන්‍ය ප්‍රයෝජනය සඳහා රාජ්‍ය පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ පුහුණු, පර්යේෂණ සහ උපදේශන ක්ෂේත්‍රයේ වෘත්තිකයන් හුවමාරු කර ගැනීම හරහා අන්‍යෝන්‍ය සබඳතා වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ වෘත්තිකයන්ගේ ජාලයකි. මෙම අවබෝධතා ගිවිසුමට මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමයේ සභාපති ඉෂාන් දන්තනාරායන මහතා සහ ශ්‍රී ලං. සං.. ප ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ප්‍රදීපා සේරසිංහ මහත්මිය

සමඟ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උපදේශකවරුන්, ශ්‍රී ලං. සං. ප. ආයතනයෙහි පීඨ සාමාජිකයින් සහ මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමයේ නිලධාරීන් කිහිප දෙනෙකුද අත්සන් කරන ලදී.




13.3. රාජ්‍ය කළමනාකරණපති පාඨමාලාව 2020-2022 සඳහා පාඨමාලාභින් බඳවා ගැනීම

රාජ්‍ය කළමනාකරණපති පාඨමාලාවේ (MPM) 2020-2022 සමාරම්භක උත්සවය 2021 ජුනි 28 වන දින මාර්ගගතව පවත්වන ලදී. උත්සවය, ශ්‍රී ලං. සං. ප. ආයතනයේ සංකථනි ශාලාවේ සිට පවත් වන ලදී. උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් සහ ශ්‍ර. ලං. සං. ප. ආයතනයේ පාලක සභාවේ සභාපති ජේ. ජේ. රත්නසිරි මහතා සහභාගි විය. අධ්‍යයන මණ්ඩල සාමාජිකයින් ද අන්තර්ජාලය හරහා සහභාගී විය. ශ්‍රී ලං. සං. ප. ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ප්‍රදීපා සේරසිංහ මහත්මිය උත්සව සභාව ඇමතූ අතර රාජ්‍ය නිලධාරීන් උසස් අධ්‍යාපනය හැදෑරීමේ වැදගත්කම පැහැදිලි කළාය. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පශ්චාත් උපාධි පාසල) (වැඩබලන) ආචාර්ය සේපාලි සුදසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන්, පශ්චාත් උපාධි අධ්‍යයන පාසල විසින් උත්සවය සංවිධානය කරන ලදී.

13.4. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 2021 (විවෘත කණ්ඩායම) සමාරම්භක උත්සවය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 2021 (විවෘත කණ්ඩායම) සමාරම්භක උත්සවය 2021 අගෝස්තු 2 වන දින ශ්‍රී ලං. සං. ප. ආයතනයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන ලේකම්තුමන් සහභාගි විය.

අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ප්‍රදීපා සේරසිංහ මහත්මිය විසින් කැඩෙට් නිලධාරීන් කොළඹ, අනුරාධපුර- මිහින්තලය, මහනුවර- පොල්ගොල්ල සහ ගාල්ල- වක්වැල්ල යන මධ්‍යස්ථාන හතරෙහිදී නවක නිලධාරීන් උණුසුම් ලෙස පිළිගනු ලැබීය. යහපත් අනාගතයක් සඳහා රට මෙහෙයවීමේ විශාල වගකීමක් මෙම නව නිලධාරීන්ට පැවරෙන බව ඇය අවධාරණය කළාය.

ප්‍රධාන ආරාධිත අමුත්තා වූ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ජේ.ජේ.රත්නසිරි මහතා සිය කතාවේදී ප්‍රකාශ කළේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නවක නිලධාරීන් දැනට දිවයිනේ සිටින රාජ්‍ය පරිපාලකයින් 3200 කට ආසන්න සංඛ්‍යාවක් සමඟ එක්වීමට වාසනාවන්ත වන බවයි.

සංස්කෘතිය, සිවිල් පරිපාලනය, සමාජීය, ආර්ථික පරිසරය, නීතිමය හා මූල්‍ය අංශ පිළිබඳව පරිපාලකයන්ට ඉතා හොඳ දැනුමක් හා අවබෝධයක් තිබිය යුතු බවත්, මනා දැනුමක් සහිතව තම වෘත්තීය ජීවිතය ආරම්භ කිරීමට සේවාරම්භක පුහුණු වැඩසටහන හොඳ අඩිතාලමක් වන බවත් ඔහු අවධාරණය කළේය.

න්‍යාය පත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නවක නිලධාරීන් සඳහා පත්වීම් ලිපි ප්‍රදානය කිරීම වන අතර ඒ සඳහා සියලුම සම්භාවනීය අමුත්තන් සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සහභාගී විය. පාඨමාලාවේ සමස්ථ සම්බන්ධීකාරක ජ්‍යෙෂ්ඨ උපදේශිකා අනුෂා බටවලගමගේ මහත්මිය ස්තුති කතාව පැවැත් වූවාය.



13.5 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2021 දී සංවර්ධනය කරන ලද නව මෘදුකාංග

1. පහත තේමාවන් සඳහා නව ඉගෙනුම් කළමනාකරණ මෘදුකාංග සංවර්ධනය කිරීම
   - සේවාරම්භක පුහුණුව සඳහා නව ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය elearn.slida.lk/induction
   - නිපුණතා සංවර්ධන පුහුණුව සඳහා නව ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය elearn.slida.lk/cbp
   - රාජ්‍ය කළමනාකරණපති පාඨමාලා පුහුණුව සඳහා නව ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය elearn.slida.lk/mpm
   - දෛනික රාජකාරී කටයුතු සඳහා නව ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය elearn.slida.lk/lms
   - මාර්ගගත විභාග සඳහා නව ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය elearn.slida.lk/exam
2. දීමනා ගෙවීම් සඳහා කෙටි පණිවුඩ දැනුම්දීමේ පද්ධතියක් නිර්මාණය කිරීම apps.slida.lk/spis
3. 2022 සිට නව වෙබ් අඩවියක් සක්‍රිය කිරීම සඳහා නව වෙබ් සේවාදායකයක් ස්ථාපිත කර ඇත



සේවාරම්භක පුහුණුව සඳහා නව ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය



නිපුණතා සංවර්ධන පුහුණුව සඳහා නව ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය

13.6 විශේෂ ජයග්‍රහණ

2021 දී, කොවිඩ්-19 වසංගතයෙන් රට දැඩි ලෙස පීඩාවට පත් වූ අතර, වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා සංචරණ සීමා පනවන ලදී. මෙය ශ්‍රී ලං. සං. ප. ආයතනයෙහි නියමිත පුහුණු වැඩසටහන් සහ උපදේශන සේවා කෙරෙහි අහිතකර ලෙස බලපෑ බැවින්, පරිශ්‍රයේ පුහුණු ක්‍රියාකාරකම් වෙනුවට බොහෝ විෂයයන් සඳහා මාර්ගගත පුහුණු සහ උපදේශන වේදිකාව වැඩිදියුණු කිරීමට ක්‍රියා කරන ලදී. තවද, මාර්ගගත පුහුණු පහසුකම් සහ වෙබ් පාදක සම්මන්ත්‍රණ ලබා ගැනීමට අවශ්‍ය තාක්ෂණික පහසුකම් රාජ්‍ය ආයතන ගණනාවකට ලබා දෙන ලදී. එකල තත්ත්වය සලකා බැලීමේදී එය අන්තර්ජාලය ඔස්සේ පුහුණු ක්‍රියාකාරකම් ලබාදීමේදී ලංකාවේ අනෙකුත් ආයතනවලටද පූර්වාදර්ශයක් විය. එසේම, ශ්‍රී. ලං. සං. ආයතනය විසින් රාජ්‍ය නිලධාරීන්ට දුරස්ථ පුහුණුව සහ ඉගෙනීම ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙහි සහාය ඇතිව "රජයේ විද්‍යුත් ඉගෙනුම් වේදිකාව (GeLP)" තවදුරටත් සංවර්ධනය කරයි. ශ්‍රී ලං. සං. ප. ආයතනයෙහි අධ්‍යයන වැඩසටහන්වලට භෞතිකව සහභාගී වීමට නොහැකි වූ නිලධාරීන්ට මෙය මහත්සේ උපකාර වූ බැවින් මෙම වැඩසටහන් කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළ ඉතා ප්‍රයෝජනවත් විය.

එසේම, 2021 දී කොවිඩ්-19 වසංගතය හේතුවෙන්, මුළු රටම අගුලු දමා තිබියදී (අගෝස්තු සිට දෙසැම්බර් දක්වා) ශ්‍රී ලං. සං. ප. ආයතනය විසින් අලුතින් බඳවාගත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා කැඩෙට් නිලධාරීන් 300 ක් පමණ සඳහා සමාරම්භක පුහුණු වැඩසටහන් සාර්ථකව පවත්වන ලදී. 'ජෙව බුබුළ' සංකල්පය මත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා බඳවා ගැනීමේ පුහුණු වැඩසටහන නේවාසික වැඩසටහන් ලෙස පහත මධ්‍යස්ථාන හතරේදී සංවිධානය කර තිබූ බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

- කොළඹ- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
- මහනුවර- පොල්ගොල්ල අධ්‍යාපන විද්‍යා පීඨය
- ගාල්ල- වක්වැල්ල කාර්මික විද්‍යාලය
- අනුරාධපුර- මිහින්තලේ රජරට විශ්වවිද්‍යාලය

මානව සම්පත් සංවර්ධනය ඉහළ නැංවීමේ සහ රාජ්‍ය අංශයට මානව සම්පත් නිසි කලට බාධාවකින් තොරව සැපයීමේ ප්‍රධාන කාර්යභාරය සහ වගකීම ශ්‍රී ලං. සං. ප. ආයතනය විසින් ඉටු කර ඇති බව එයින් පෙන්නුම් කෙරේ. රජයේ කාර්යාලවල කනිෂ්ඨ මට්ටමේ විධායක නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීමට ඉවහල් වූ ඉහත වැඩසටහන අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ ඉහළ ඇගයීමට ලක්ව ඇත.

14. විගණන කමිටුවේ වාර්තාව

2021.11.16 දිනැති අංක 2021/01 දරන රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 4.2 ඡේදයේ විධිවිධාන අනුව, දැනට සාමාජිකයින් හතර දෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුව, ආයතනයේ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා පාලක සභාවට සහය වේ. ගිණුම්කරණ ප්‍රමිති, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය, ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය සමඟ ගුණාත්මක මූල්‍ය ප්‍රකාශන සම්පාදනය කර ඇත.

විගණන හා කළමනාකරණ කමිටුව

සංයුතිය සහ රැස්වීම්

2021 වර්ෂය සඳහා පාලක සභාව විසින් පත් කරන ලද විගණන කමිටුවේ සාමාජිකයින් පහත පරිදි වේ.

නම	පත්වීම් දිනය
එම්. එස්. එස්. එස්. ප්‍රනාන්දු මහතා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, මුදල් අමාත්‍යාංශය	2021.03.17 සිට මේ දක්වා
නිශාන්ත වීරසිංහ මහතා අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය	2021.10.07 සිට මේ දක්වා
ගෝඨාභය ජයරත්න මහතා ශ්‍රී. ලං. සං. ප ආයතනයේ පාලක සභා සාමාජික	2021.03.31 සිට මේ දක්වා
කෞෂාල් මෙන්ඩිස් මහතා ශ්‍රී. ලං. සං. ප ආයතනයේ පාලක සභා සාමාජික	2021.03.03 සිට මේ දක්වා
සුමිත් අබේසිංහ මහතා ශ්‍රී. ලං. සං. ප ආයතනයේ පාලක සභා සාමාජික	2020.09.10 සිට - 2021.04.09 දින එම රැස්වීම් දිනයේ ඉල්ලා අස් විය.
ආර්. ජී. පණ්ඩිත කෝරළගේ ශ්‍රී. ලං. සං. ප ආයතනයේ පාලක සභා සාමාජික	2020.03.03 සිට - 2021.10.04 දින එම රැස්වීම් දිනයේ ඉල්ලා අස් විය.

අභ්‍යන්තර විගණක, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා කමිටුවේ ලේකම්වරයා ලෙස ක්‍රියා කළේය. වර්ෂය තුළ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් පැවැත්විණි. වසංගත තත්ත්වය හේතුවෙන් දෙවන කාර්තුවේ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි නොපැවැත්විණි (2021.08.20 සිට 2021.10.01 දක්වා රට අගුලු දමා තිබිණ). රට සාමාන්‍යකරණය කිරීමෙන් පසු 03 වන කාර්තුව සහ 4 වන කාර්තුවේ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විණි. 2021 දී විගණන කමිටුව විසින් සාකච්ඡා කරන ලද ප්‍රධාන න්‍යාය පත්‍ර අයිතම පහත පරිදි ඇතුළත් විය.

රැස්වීම් අංක සහ දින	සාකච්ඡා කරන ලද අයිතම
2021/01 – 2021.04.09	• අනුකූලතා වාර්තාව • ව්‍යවස්ථාපිත බැඳීම්වල තත්ත්වය • 2019 බාහිර විගණන විමසුම් සහ කළමනාකරණ ප්‍රතිචාර. • 2020 අභ්‍යන්තර විගණන විමසුම් සහ කළමනාකරණ ප්‍රතිචාර.
2021/02 – 2021.10.04	• අනුකූලතා වාර්තාව • බාහිර විගණන විමසුම් සහ කළමනාකරණ ප්‍රතිචාර

	• 2022 සඳහා ශ්‍රී. ලං. සං. ප ආයතනයේ කෙටුම්පත් අයවැය • ව්‍යවස්ථාපිත බැඳීම්වල තත්ත්වය
2021/03 – 2021.12.16	• අනුකූලතා වාර්තාව • 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) (A) වගන්තියට අනුව 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව • ව්‍යවස්ථාපිත බැඳීම්වල තත්ත්වය

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත, විගණන අධිකාරී කේ.ආර්.ටී.මැණිකේ මහත්මිය නිරීක්ෂකයෙකු ලෙස සහභාගී විය. ඊට අමතරව, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ද ශ්‍රී ලං. සං. ප. ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී විය. නිශ්චිත කරුණු සම්බන්ධයෙන් විගණන කමිටුව වෙත සැකෙවින් කරුණු ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලං. සං. ප. ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත වරින් වර කැඳවීම් කරන ලදී.

විගණන කමිටුවේ අරමුණ සහ වගකීම්

PED 2021/01 දරන පොදු ව්‍යවසාය චක්‍රලේඛයට අනුව කමිටුව පහත වගකීම් සහ රජයේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරයි.

I. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සකස් කිරීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රමාණවත් බව;
II. මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා, ආයතන පනත්වල තොරතුරු අවශ්‍යතා, සමාගම් පනත සහ අනෙකුත් අදාළ මූල්‍ය වාර්තාකරණයට අදාළ රෙගුලාසි සහ අවශ්‍යතාවලට අනුකූල වීම;
III. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල අවශ්‍යතා සපුරාලීම සඳහා ආයතනයේ අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි ප්‍රමාණවත් බව සහතික කිරීමේ ක්‍රියාවලි;
IV. ආයතනයේ අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්ය සාධනය සහතික කිරීම;
V. RC නොමැති විට සැලකිය යුතු ව්‍යාපාර/මූල්‍ය අවදානම් හඳුනා ගැනීම, අධීක්ෂණය සහ කළමනාකරණය කිරීම;
VI. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ සහ ප්‍රධාන කළමනාකාරීත්වයේ පුද්ගලයන්ගේ අදාළ පාර්ශවීය ගනුදෙනු වාර්තා කිරීම.

<u>මූල්‍ය වාර්තාකරණය</u>

පාර්ශ්වකරුවන්ට ලබා දී ඇති තොරතුරුවල විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා කමිටුව විසින් මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ ඵලදායීතාවය සමාලෝචනය කරනු ලබයි. ගිණුම් පොත් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ඔවුන්ගේ වගකීම ඉටු කිරීමට කමිටුව පාලක සභාවට සහාය වේ. සියලුම ගනුදෙනු නිවැරදිව හා සම්පූර්ණයෙන් ගිණුම් පොත්වල සටහන් කර ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සහ ඵලදායීතාව පිළිබඳ කමිටුව සමාලෝචනය කරයි.

කමිටුව විසින් මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සකස් කරන ලද වැදගත් උපකල්පන සහ විනිශ්චයන් ඇතුළත් ආධාරක තොරතුරු සමග සියලුම විගණනය නොකරන ලද කාර්තුමය අතුරු මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන, සමාලෝචනය කර ඇත.

අභ්‍යන්තර පාලනය

මූල්‍ය වාර්තාකරණ පද්ධතිය මත අභ්‍යන්තර පාලනයේ සඵලතාවය විගණන කමිටුව විසින් තක්සේරු කරන ලදී.මෙම ක්‍රියාවලිය අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය සහතික කරන අතර නීති හා රෙගුලාසි වලට අනුකූලව අවදානම් පාලනය කිරීමේ ක්‍රියාවලියද තක්සේරු කරනු ලබයි. ශ්‍රී ලං. සං. ප. ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරුන්ගේ නිර්දේශ මත කළමනාකාරිත්වය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව කමිටුව සහතික කරයි. අභ්‍යන්තර පාලන රාමුවේ පදනම, පාලක මණ්ඩලයට එහි කාර්යයන් කරගෙන යාමට සහ අවශ්‍ය පියවර ගැනීමට ඉඩ සලසයි.

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන කාර්යය විගණනය කරන ක්‍රියාකාරකම් වලින් ස්වාධීන වන බවත් එය අපක්ෂපාතී ප්‍රවීණතාවයෙන් හා නිසි වෘත්තීය රැකවරණයෙන් යුතුව සිදු කරන බවට විගණන කමිටුව සහතික කරයි. ශ්‍රී ලං. සං. ප. ආයතනයේ අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරකම්වල විෂය පථය, සම්පත්, වපසරිය හා ඵලදායීතාව විගණන කමිටුව විසින් අධීක්ෂණය කර සමාලෝචනය කරන ලදී.

එම්.එස්.එස්.එස්. ප්‍රනාන්දු
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PAF/B/SLIDA/01/2021/11

මගේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 මැයි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 41 වගන්තියට අනුව පශ්චාත් උපාධි අධ්‍යයන අංශයේ හා භාෂා අංශයේ ලැබිය යුතු ශේෂ සඳහා වූ රු. 13,378,660 ක හානිකරණ අගය ප්‍රවර්තන වර්ෂයේ ලාභයට එරෙහිව කපා හරිනු වෙනුවට පූර්ව වර්ෂ ගැලපීමක් ලෙස සමුච්චිත අතිරික්තයට ලියා හැර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉහත ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු. 210,069,771 ක් වූ ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වසර 05 ඉක්මවූ රු.7,610,160 ක් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද එවැනි ශේෂයක් ගෙවීමට ඇති බවට අමාත්‍යාංශ වාර්තාවලින් සනාථ නොවුණ ද ඒ පිළිබඳ සලකා බලා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) එක් එක් ණයගැති ශේෂය පිළිබඳව විස්තරාත්මක ඇගයීමක් කර වෙන් කළ යුතු අඩමාණ ණය ප්‍රමාණය තීරණය කරනු වෙනුවට ණයගැති ශේෂය තුළ ඇතුළත්ව තිබුණු පශ්චාත් උපාධි අධ්‍යයන අංශයෙන් ලැබිය යුතු රු.19,145,750 ක් වූ ණය ශේෂය වෙනුවෙන් පදනමකින් තොරව එම ශේෂයෙන් සියයට 10 ක් හෙවත් රු. 1,914,576 ක අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කර මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුලත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ "ඇ" හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති රීති විධානයට යොමුව	නිරීක්ෂණය
	---	---
(අ)	1971අංක 38 දරණ මුදල් පනතේ 10 (05) වගන්තිය	විසර්ජනයකින් පසු ඉතිරි වන ශුද්ධ ආදායම් ඒකාබද්ධ අරමුදලට යැවිය යුතු වුවත් ආයතනය එයට අනුකූලව කටයුතු කර නොතිබුණි.
(ආ)	1982 අංක 9 දරණ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ 31 වන වගන්තිය	කිසිදු නීතියක් අමාත්‍යවරයා අනුමත කරන තුරු බලාත්මක නොවන නමුත් පශ්චාත් උපාධි අධ්‍යයන අංශයේ අතුරු නීති සංග්‍රහය (By Laws) සඳහා අදාල අනුමැතිය ලබා ගැනීමකින් තොරව පශ්චාත් උපාධි අංශයේ මාර්ගෝපදේශයක් වශයෙන් එය භාවිතා කර තිබුණි.

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය:	
	මුදල් රෙගුලාසි 571	වර්ෂ දෙක ඉක්මවූ රදවාගත් නැන්පතු රු.520,015 ක් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඈ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර වක්‍රලේඛය	2013 වර්ෂයට පෙර මිලදී ගත් පිරිවැය රු. 157,380,495 ක් වූ වත්කම් සඳහා විස්තරාත්මක තොරතුරු ඇතුළත් කර ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
(ඉ)	2015 ජූනි 17 දිනැති අංක PED 03/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 2.8 වගන්තිය	වක්‍රලේඛයේ දක්වා ඇති ගෙවීම් වලට අමතර ගෙවීම් සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව පාලක සභා ලේකම් තනතුරේ රාජකාරී ආවරණය කරන නිලධාරිණියට එක් රැස්වීම් වාරයක් සඳහා රු.3,000 බැගින් අවස්ථා 08කදී සහභාගි වීමේ දීමනාවක් හා අධ්‍යයන කටයුතු මණ්ඩලයේ (AAB) සහ ව්‍යාපෘති අධ්‍යයන (PTS) කමිටු සාමාජිකයන් හයදෙනෙකු වෙත අවස්ථා 12කදී රු.6,000 බැගින් සහභාගි වීමේ දීමනාවක් ලෙස එකතුව රු.440,500 ක් ගෙවා තිබුණි.
(ඊ)	2021 නොවැම්බර් 16 දිනැති අංක PED 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 2.6 වගන්තිය	පාලක මණ්ඩල ලේකම් තනතුර දරන්නා සුදුසුකම් ලත් වරලත් ලේකම් වරයෙකු විය යුතු වුවත් ආයතනයේ පාලක මණ්ඩල ලේකම් ලෙස කටයුතු කරන නිලධාරිණිය විසින් එම සුදුසුකම් සපුරා නොතිබුණි.
(උ)	බාහිර උපදේශන සේවා සඳහා වන නීති රීති සංග්‍රහය	(i) අංක 07 ඡේදය ප්‍රකාරව සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතන ඇතුළුව රජයේ ආයතනයකට ගාස්තු අයකරන උපදේශන සේවය ක්‍රියාත්මක නොකළ යුතු වුවත් පාලක සභා අනුමැතියක් මත සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ආයතන 12කින් රු.222,975 ක් අයකර තිබුණි.

(ii) ඇස්තමේන්තු සැකසීමේ ක්‍රියාවලියේ F කාණ්ඩය අනුව සහාය කාර්ය මණ්ඩල දිමනාව මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා පිළිවෙලින් සියයට 3ක් හා සියයට 7ක් ලෙස ගෙවිය යුතු වුවත් විභාග පැවැත්වීම වෙනුවෙන් සහය කාර්ය මණ්ඩල දිමනාව මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා පිළිවෙලින් සියයට 3.8 ක් හා සියයට 6.2 ක් ලෙස ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) 2013 අප්‍රේල් 19 දිනැති අංක අමප/13/0237/523/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ද්විතියන අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත සියයට 50ක ද්විතියන දිමනාවක් ගෙවා තිබුණි. එම දිමනාව ගෙවීම සඳහා 2014 නොවැම්බර් 14 දිනැති පොදු ව්‍යාපාර කාරක සභාවේදී මාසිකව ඉටුකල යුතු අවම දේශන පැය ප්‍රමාණය පැය 45 ක සීමාව වෙත ලඟාවිය යුතු බවට තීරණය කර තිබුණි. එහෙත්, 2015 ජූලි සිට 2021 ජනවාරි 31 දින දක්වා එසේ අවම දේශන පැය ගණන ආවරණය නොකරන ලද දේශකවරයන්ගෙන් අයකර ගත යුතු රු.7,785,350 ක් අයකර නොතිබුණි.

(ආ) පශ්චාත් උපාධි පාඨමාලා සඳහා කාර්ය මණ්ඩල ගෙවීම් සැලසුම් හා හාරදීමේ කමිටුවේ අනුමැතිය පරිදි සිදු කර තිබුණද මෙලෙස සැලසුම් හා හාරදීමේ කමිටුවක් මඟින් ගෙවීම් අනුමත කිරීම සම්බන්ධව භාණ්ඩාගාර අනුමැතිය ලද "බාහිර සේවා සඳහා වූ නීති සංග්‍රහයේ (Rules relating to external Services)" ඇතුළත් කර නොතිබුණි.

(ඇ) 2013 පෙබරවාරි 07 දිනැති අංක 13/0150/523/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ආයතනය පිහිටවනු ලැබූ පනත සංශෝධනය කිරීමට අනුමැතිය ලබා දී තිබුණ ද, එම අනුමැතිය ලැබී වර්ෂ 9 ක් ගතවී ඇතත් එය සිදුකර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පුහුණු වැඩසටහනක් සඳහා ලැබුණු රු.2,094,163ක මුදල පුහුණු වැඩසටහන් පැවැත්වීම හෝ ගෙවා නිදහස් කිරීමකින් තොරව වර්ෂ 05කට වැඩි කාලයක සිට ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති